# <u>2025 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාව</u>

# <u>ජාතික පොලිස් කොමිෂන් සභාව</u>

# <u>වැය ශීර්ෂ අංකය 08</u>

# අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ ....................1

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම ....................9

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය ....................27

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක ....................37

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය ....................38

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ ....................40

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව ....................42

# 01 පරිච්ඡේදය

# ආයතනික පැතිකඩ

## 1.1 හැඳින්වීම

2002 වර්ෂයේ 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මෙරට තුළ පිහිටවනු ලැබූ ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනත් කවර රාජ්‍ය ආයතනයකටත් වඩා බලතල හා කාර්යභාරය වරින්වර වෙනස් වෙමින් ක්‍රියාත්මක වූ ආයතනයකි. 2002 වසරේදී 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පොලිස්පතිවරයා හැර සියලුම පොලිස් නිලධරයන්ගේ පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහකිරීමේ බලතල සහ පොලිස් නිලධරයෙකුට හෝ පොලිස් සේවයට හෝ එරෙහිව මහජනයාගෙන් ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීමේ බලතල කොමිෂන් සභාව වෙත හිමිවිය. එසේ වුවද 2010 වසරේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කරන ලද 18 වන සංශෝධනය මගින් ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල පොලිස් නිලධරයන්ට එරෙහිව ඉදිරිපත් වන මහජන පැමිණිලි විමර්ශනය කිරීම සඳහා පමණක් සීමාවිය. නැවතත් 2015 වසරේ දී 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පොලිස් නිලධරයන්ගේ පත් කිරීම්, මාරු කිරීම් හා විනය බලතල මෙන්ම මහජන පැමිණිලි විමර්ශන බලතල ද කොමිෂන් සභාව වෙත පැවරිණි. 2020 වසරේ දී 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සශෝධනය මගින් කොමිෂන් සභාවේ බලතල නැවතත් මහජන පැමිණිලි විමර්ශනය කිරීමේ බලතලවලට පමණක් සීමාවිය.

කෙසේ වෙතත් 2022 ඔක්තෝම්බර් මස 31 වන දින සම්මත කරන ලද 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් නැවතත් ජාතික පොලිස් කොමිෂන් සභාව පූර්ණ බලතල සහිතව ස්ථාපිත කරනු ලැබීය. 2023 මැයි මස 16 වන දින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ගරු ජනාධිපතිතුමා විසින් විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු ඊ.ඩබ්.එම්. ලලිත් ඒකනායක මහතාගේ සභාපතිත්වයෙන් යුතුව හත්වන කොමිෂන් සභාව සඳහා සාමාජික සාමාජිකාවන් පත් කරන ලදී.

ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල වපසරිය සලකා බලන විට එක් අතකින් පොලිසියේ පත්කිරීම්, උසස්කිරීම්, ස්ථාන මාරුකිරීම්, විනය පාලනය වැනි කාර්යන් හරහා පොලිසිය ස්වාධීන, වෘත්තීය, සහ අපක්ෂපාතී මහජන ආයතනයක් ලෙසත්, අනෙක් අතට මහජනතාවට පොලිස් නිලධාරීන්ගෙන් සිදුවන යම් අගතිගාමී තත්වයකදී ඔවුන් විසින් පොලිස් නිලධරයන්ට එරෙහිව ඉදිරිපත් කරන පැමිණිල් විමර්ශනය කිරීමත් යන ද්විත්ව බල ව්‍යුහයකින් සමන්විත වේ.

21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් නව බලතල කොමිෂන් සභාවට ලැබීමත් සමග එතෙක් පොලිස් නිලධාරීන්ගේ ආයතනික හා අභියාචනා කටයුතු ඉටුකළ රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක කරමින් තිබූ ලිපිගොනු 10,696 ක් ජාතික පොලිස් කොමිෂන් සභාවට බාරදෙනු ලැබූ අතර, පොලිස් නිලධරීන්ගේ විවිධ අභියාචනා සහිත එම ලිපිගොනු කඩිනමින් විමර්ශනය කර අවසන් කිරීමට පසුගිය කාලය තුළ කටයුතු කිරීමට සිදුවිය. ඉහත ලිපි ගොනු වලට අමතරව දෛනිකව

මහජනතාවගෙන් සහ පොලිස් නිලධාරීන්ගෙන් ලැබෙන අභියාචනා ඇතුළු විවිධ ඉල්ලීම් සම්බන්ධයෙන් ද කටයුතු ඉටු කරනු ලබන අතර 2025 වසර තුළ පමණක් එවැනි ඉල්ලීම් 14,624 ක් ලැබී ඇත.

2025 සමාලෝචිත වර්ෂය අවසන් වන විට නව කොමිෂන් සභාව පත්වී වසර දෙකහමාරක පමණ කාලයක් ගත වී ඇති අතර එම කාලය තුළ ඉටුකිරීමට සිදුවූ කටයුතු අතර පොලිස් සේවාව ස්වාධීන, කාර්යක්ෂම සහ අපක්ෂපාතී සේවාවක් බවට පත් කිරීම සම්බන්ධයෙන් වැදගත් ප්‍රතිපත්තිමය තීරණ ගණනාවක් ගෙන ඇත. 2024 සැප්තැම්බර් 21 වන දිනට දින නියම කළ ජනාධිපතිවරණය අවස්ථාව වන විට හිටපු පොලිස්පතිවරයා හට ධූරය දැරීම වලකාලමින් ශ්‍රේෂ්ඨාධිකරණය නියෝගයක් නිකුත් කර තිබූ පසුබිම තුළ සහ වැඩ බලන පොලිස්පතිවරයෙකු හෝ පත් නොකර සිටි පසුබිම තුළ සහ එවකට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන) තනතුරේ සේවය කළ නිලධරයා විනය කටයුතු හේතුවෙන් අනිවාර්ය නිවාඩු ගන්වා සිටි පසුබිමක ජාතික පොලිස් කොමිෂන් සභාව ස්වකීය බලතල උපයෝගී කරගනිමින් තාවකාලික පදනමින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති පරිපාලන තනතුරෙහි වැඩ බැලීම සඳහා නිලරයෙකු පත්කිරීම මගින් ජනාධිපතිවරණය අභියස රට තුළ යම් අස්ථාවර ස්වභාවයක් ඇති වීම වැලැක්වීමට අවශ්‍ය පියවර ගනු ලැබීය.

පොලිස් සේවාවේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට අවශ්‍ය කරන ප්‍රතිපත්තිමය තීරණවලට අමතරව කොමිෂන් සභාවේ බලතල, කාර්යභාරය සහ වගකීම් පිළිබඳව සහ මහජන පැමිණිලි විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ වගකීම සම්බන්ධයෙන් දිවයින පුරා රාජකාරියේ නියුතු පොලිස් නිලධරයන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 2024 දෙසැම්බර් 24 මධ්‍යම පළාතෙන් ආරම්භ කර 2025 වර්ෂය තුළ පළාත් 05 ක එනම්, දකුණ, සබරගමුව, බස්නාහිර, වයඹ සහ උතුරුමැද යන පළාත් වල සියලු පොලිස් කොට්ඨාස ආවරණය කරමින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ඇතුළුව සෑම තරාතිරමකම නිලධාරීන් 2,604 දැනුවත් කර ඇත. ඉතිරි පළාත්වල පොලිස් කොට්ඨාස 2026 වර්ෂය තුළ පවත්වා අවසන් කිරීමට සියලු සැලසුම් සකස්කර ඇත.

මෙම සම්මන්ත්‍රණ සඳහා පොලිස් කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ සහ ලේකම් ගේ සෘජු සහභාගීත්වය සහිතව කොමිෂන් සභාවේ අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද සම්පත් දායකයින් ලෙස සහභාගී වීම විශේෂ තත්වයකි. එමෙන් ම කොමිෂන් සභාවේ කාර්යභාරය හා වගකීම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට කොමිෂන් සභාවේ අවධානය යොමු වී ඇති අතර මෙම කටයුතු ඉටුකිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික හා මූල්‍යමය සහය ලබාගැනීමට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සමඟ සාකච්ඡා සිදුකරමින් පවතී.

හත්වන කොමිෂන් සභාව 2023 වර්ෂයේ කටයුතු ආරම්භ කරනවිට නව බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තරම් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් ජාතික පොලිස් කොමිෂන් සභා කාර්යාලය සතුව

නොමැතිවීම එම බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පැවති විශාල අභියෝගයක් මෙන්ම බාධාවක් විය. ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත අත්‍යවශ්‍ය කාර්ය මණ්ඩලය අනුමත කරගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ගණනාවක් ඉදිරිපත් කරමින් විවිධ උත්සාහයන් දැරුවද මෙතෙක් අපේක්ෂිත කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට නොහැකි වී ඇති අතර තවදුරටත් ඒ පිළිබඳව උත්සාහයන් දරමින් සිටී. එසේම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්ය මණ්ඩලය අතරින් ද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/III ශ්‍රේණිවල අනුමත තනතුරු 08 ක් ඇතුළුව මුළු පුරප්පාඩු සංඛ්‍යාව 26 ක කාර්යමණ්ඩල හිඟයක් ද සහිතව කොමිෂන් සභාවට කටයුතු කිරීමට සිදුවී ඇති බව සඳහන් කළ යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ලද ලිපිගොණු සම්බන්ධව කටයුතු කිරීමේ දි සීමිත කාර්ය මණ්ඩලයක් මගින් කාර්යක්ෂම ලෙස රාජකාරි කටයුතු කළමනාකරණය කිරීමටත්, නව කාර්යමණ්ඩලය බඳවා ගැනීමට/ අනුයුක්ත කර ගැනීමටත් විශාල වෙහෙසක් දැරීමට සිදුවිය. එසේම කොමිෂන් සභාවේ නව බලතල ක්‍රියාත්මක කිරීම සඳහා භෞතික සම්පත් සම්පාදනය කර ගැනීමට ද මෙම කාලය තුළ හැකිවිය. මේ යටතේ කොමිෂන් සභාව සඳහා අමතර ඉඩපහසුකම් BMICH පරිශ්‍රය තුලින්ම ලබා ගැනීමට හැකිවිය. පැරණි වාර්තා පොත්පත් ගබඩා කර ඇති ලේඛනාගාරය තොරතුරු දැන ගැනිමේ පනත යටතේ ලිපිගොනු සංරක්ෂණය කිරීම සඳහා පූර්ණ ලෙස ප්‍රතිසංවිධානය කර යාවත්කාලීන කිරීම 2024 වර්ෂය තුළ අවසන් කර ඇත. මීට අමතරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් එකවර ලද ලිපිගොනු සහ පොලිස් නිලධාරීන්ගෙන් දෛනිකව ලැබෙන සියලු ලිපිගොනු එක් පරිගණක දත්ත පද්ධතියකට ඇතුලත් කිරීම සිදු කර ඇති අතර එය මේ කාලය තුළ කොමිෂන් සභාව ලබාගත් විශාල ජයග්‍රහණයකි. ලේඛනාගාරයේ පැරණි ලිපිගොණු පහසුවෙන් සහ කඩිනමින් සොයා ගැනීමට හැකිවන පරිදි 29892ක් පමණ ලිපිගොණු ප්‍රමාණයක් පරිගණක ගත කර ඇත.

**2025 සමාලෝචිත වර්ෂය තුළ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාවෙන් පවරා ඇති වගකීම් ඉටු කිරීමේ දී අත්පත්කරගෙන ඇති කාර්ය සාධනය ගුණාත්මක සහ ප්‍රමාණාත්මක පැතිමානයන් මෙම වාර්තාව මගින් ඉදිරිපත්කර ඇත.**

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

"විශ්වසනීයවූත්, ස්වාධීනවූත්, වෘත්තීමය පොලිස් සේවයක් තුළින් සුරක්ෂිත, නිරුපද්‍රිත සහ සාමකාමී සමාජයක් නිර්මාණය කිරීමට සහාය වීම"

### මෙහෙවර

"මානව අයිතිවාසිකම්වලට ගරු කරමින්, නීතිය සහ සාමය පවත්වා ගනිමින්, මහජන වගවීම සහතික කරමින්, නීතියේ ආධිපත්‍ය තහවුරු කරමින්, කාර්යක්ෂම, මහජන අභිලාෂයන්ට ප්‍රතිචාර දක්වන සේවාවක් බවට ශ්‍රී ලංකා පොලිස් සේවය පරිණාමණය කිරීම."

### අරමුණු

- පොලිස් සේවාවේ මානව සම්පත් ඵලදායී ලෙසත්, කාර්යක්ෂම ලෙසත් කළමනාකරණය කිරීම තුළින් ගුණාත්මක ප්‍රතිපත්ති සහ යහපත් පරිචයන් ක්‍රියාවට නංවමින්, වෘත්තීමය වශයෙන් උසස් සහ තෘප්තිමත් පොලිස් සේවයක් ඇති කිරීම.

- කිසිදු නොමනා අගතියකින් හෝ අනුග්‍රහයකින් මෙන්ම වෙනස් කොට සැලකීමකින් තොරව මානව අභිමානය සහ නීතියේ ආධිපත්‍ය සුරක්ෂිත කිරීමේ අරමුණ ඇතිව පොලිසියට එරෙහිව ඇති මහජන පැමිණිලි කඩිනමින් විමර්ශනය කිරීම මගින් මහජන අභිලාෂයන්ට ප්‍රතිචාර දැක්වීම සහ වගවීම.

- මානව සුරක්ෂිතතාව ඇතිකිරීම සහ අපරාධ වැලැක්වීම අවධාරණය කරමින්, වෙනත් පාර්ශව කරුවන් සමග සමීප සහයෝගීතාවයකින් යුක්තව විවිධ පියවර සැලසුම් කරමින් සහ ක්‍රියාවට නංවමින් පොලිස් සේවයේ කාර්යක්ෂමතාව සහ ස්වාධිනත්වය වැඩි දියුණු කිරීම සඳහා සාකල්‍යමය ප්‍රවේශයක් අනුගමනය කිරීම.

### වටිනාකම්

ස්වාධීනත්වය
අවංකභාවය
වගවීම
අපක්ෂපාතීත්වය
සහයෝගීතාව
අඛණ්ඩ ඉගෙනුම
නිර්මාණශීලීත්වය

## 1.3 ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල හා කාර්යභාරය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 21 වන සංශෝධනයේ 155 උ(1)(අ) වගන්තිය ප්‍රකාරව පොලිස් කොමිෂන් සභාව වෙත පවරා ඇති බලතල සහ කාර්යභාරය පහත සඳහන් පරිදි වේ.

(1) පොලිස්පතිවරයා හැර, පොලිස් නිලධරයන් පත්කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය සහ ඔවුන් සේවයෙන් පහ කිරීමේ බලය ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පැවරිය යුත්තේය.

(2) මහජනයාගෙන් ලැබෙන පැමිණිලි සහ අතෘප්තියට පත් යම් තැනැත්තෙකු විසින් පොලිස් නිලධරයෙකුට හෝ පොලිස් සේවයට හෝ විරුද්ධව ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාර ගැනීමේ සහ ඒවා විමර්ශනය කිරීමේ කාර්ය පටිපාටි කොමිෂන් සභාව විසින් පිහිටුවිය යුතු අතර, පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක විධිවිධාන සලසා ඇති පරිදි සහන සැලසිය යුත්තේය .

(3) පොලිස් කොමිෂන් සභාව විසින් පොලිස්පතිවරයා විමසා පොලිස් නිලධාරින් සම්බන්ධයෙන් වූ පහත සඳහන් සියලු කාරණා සඳහා කටයුතු සැලසීමද, ඒ කාරණා නිශ්චය කිරීමද කරනු ලැබිය යුත්තේය.

(අ) තත්කාර්ය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් ප්‍රතිපත්තියකට යටත්ව පොලිස් නිලධාරින් බඳවා ගැනීම, උසස් කිරීම සහ ස්ථාන මාරු කිරීම පිළිබඳ පටිපාටි සකස් කිරීම;

(ආ) පුහුණුව සහ පොලිස් සේවයේ කාර්යක්ෂමතාව හා ස්වාධීනත්වය වැඩිදියුණු කිරීම;

(ඇ) ජාතික හා පළාත් අංශයේ භාවිතය සඳහා අවශ්‍ය අවි ආයුධ, වෙඩි ද්‍රව්‍ය සහ වෙනත් උපකරණවල ස්වභාවය සහ වර්ගය තීරණය කිරීම; සහ

(ඈ) චර්යා සංග්‍රහය සහ විනය පිළිබඳ පටිපාටි සකස් කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 09 වන උප ලේඛනයේ I වන පරිශිෂ්ටයේ 1 වන ලැයිස්තුවේ සඳහන් පරිදි කොමිෂන් සභාව වෙත පවරා ඇති සියලු බලතල ක්‍රියාත්මක කිරීම හා සියලු කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් කරනු ලැබිය යුතුය.

## 1.4 කොමිෂන් සභාවේ සංයුතිය

**සභාපති**

ඊ.ඩබ්ලිව්.එම්. ලලිත් ඒකනායක මහතා ( විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු)

**සාමාජිකයින්**


1. ඩී.කේ. රේණුකා ඒකනායක මහත්මිය (විශ්‍රාමලත් අමාත්‍යාංශ ලේකම් - 2025 වර්ෂයේ ඉල්ලා අස්විය)
2. කනපතිපිල්ලේ කරුණාහරන් මහතා ( විශ්‍රාමලත් දිස්ත්‍රික් ලේකම්)
3. ජේ.ඒ. ජයසිංහ මහතා (විශ්‍රාමලත් නියෝජ්‍ය පොලිස්පති)
4. දිල්ෂාන් කපිල ජයසූරිය මහතා (ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ)
5. ඒ. ඒ. එම්. ඉල්ලියාස් මහතා (ජනාධිපති නීතිඥ)

**ලේකම්**

තනුජා එන්. ප්‍රනාන්දු මහත්මිය (ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන ශ්‍රේණිය)

## 1.5 සංවිධාන සටහන

**ජාතික පොලිස් කොමිෂන් සභාව**
**සංවිධාන ව්‍යුහය**



## 1.6 කොමිෂන් සභාවේ ප්‍රධාන අංශ සහ ඒකක

1. පාලන, පර්යේෂණ හා සංවර්ධන අංශය

    1.1 පාලන අංශය

    1.2 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය

    1.3 මාධ්‍ය ඒකකය

2. මහජන පැමිණිලි විමර්ශන අංශය

    2.1. ප්‍රධාන කාර්යාලයේ විමර්ශන අංශය

    2.2 පළාත් කාර්යාල - 10

බස්නාහිර පළාත් කාර්යාලය I, බස්නාහිර පළාත් කාර්යාලය II. දකුණු පළාත් කාර්යාලය, උතුරු පළාත් කාර්යාලය, උතුරුමැද පළාත් කාර්යාලය, වයඹ පළාත් කාර්යාලය, මධ්‍යම පළාත් කාර්යාලය, නැගෙනහිර පළාත් කාර්යාලය, ඌව පළාත් කාර්යාලය, සබරගමුව පළාත් කාර්යාලය.

3. ආයතන හා විනය අංශය

4. අභියාචනා අංශය

5. නීති ඒකකය

6. අභ්‍යන්තර විගණන ඒකකය

7. ගිණුම් / මූල්‍ය අංශය

## 1.7 අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතන අරමුදල්

පොලිස් කොමිෂන් සභාවට මෙය අදාළ නොවේ. (ජාතික පොලිස් කොමිෂන් සභාව ජනාධිපති කාර්යාලය යටතේ ක්‍රියාත්මක වේ.)

## 1.8 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

මේ වන විට විදේශ ආධාර ලබා ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන වැනි ආයතන සමඟ සාකච්ඡා පැවැත්වෙන අතර ආධාර ලබා ගැනීම සඳහා උත්සුක වෙමින් සිටී.

# 02 පරිච්ඡේදය

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## එක් එක් අංශවල ප්‍රගතිය, මුහුණදුන් අභියෝග සහ ඉදිරි ඉලක්ක

## 2.1 පාලන පර්යේෂණ හා සංවර්ධන අංශය

කොමිෂන් සභාව සතු මානව සම්පත් පරිපාලනය හා කළමනාකරණය, නව නිලධාරින් බඳවා ගැනීම, කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය පුහුණුවීම් හා මග පෙන්වීම් ලබා දීම, කොමිෂන් සභාවට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ එදිනෙදා පරිපාලන කටයුතු ඉටුකිරිම, කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ මානව සම්පත් ප්‍රවර්ධනය හා ධාරිතා සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම, කොමිෂන් සභාවේ සියළුම ප්‍රසම්පාදන කාර්යයන්, පරිපාලන අවශ්‍යතාවයන් සඳහා කොමිෂන් පත්‍රිකා සැකසීම හා ඊට අනුගත ක්‍රියා ඉටුකිරීම පාලන අංශය සතු ප්‍රධාන කාර්යයන් හා වගකිම් වන්නේය. මහජන පැමිණිලි විමර්ශන කටයුතු සඳහා පළාත් මට්ටමින් පිහිටුවා ඇති කාර්යාල සම්බන්ධයෙන් වන පරිපාලන කටයුතුද මෙම අංශයේ කාර්ය භාරයට ඇතුළත් වේ.

## 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ ලැබී ඇති ඉල්ලීම් (2025.01.01 – 2025.12.31 දක්වා)

| | |
|---|---|
| ලැබී ඇති ඉල්ලීම් ගණන | - 360 |
| තොරතුරු ලබා දී ඇති ඉල්ලීම් ගණන | - 285 |
| ප්‍රතික්ෂේපිත ඉල්ලීම් ගණන | - 36 |

### 2.1.1 පර්යේෂණ හා සංවර්ධන අංශය

**පොලිස් කොමිෂන් සභාවේ බලතල, කාර්යභාරය හා වගකීම් පිළිබඳ පොලිස් කොට්ඨාස මට්ටමින් පොලිස් නිලධාරීන් දැනුම්වත් කිරීමේ වැඩසටහන - 2025**

සංඛ්‍යා ලේඛන විශ්ලේෂණ දත්ත සහ ජනමාධ්‍ය මගින් හෙළිදරව් කරන පොලිස් නිලධාරින් සම්බන්ධව වන විවිධ නීති විරෝධි ක්‍රියා, මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සහ මහජන මිත්‍රශීලී පොලිසියක් සඳහා බාධක ලෙස පවතින වෘත්තිමය නොවන කටයුතු පිළිබඳව අවධානය යොමු කළ ජාතික පොලිස් කොමිෂන් සභාව පොලිස් කොමිෂන් සභාවේ බලතල, කාර්යභාරය හා වගකීම් පිළිබඳ පොලිස් කොට්ඨාස මට්ටමින් පොලිස් නිලධාරීන් දැනුම්වත් කිරීමේ වැඩසටහන 2025 වර්ෂය තුළ දී දකුණ, සබරගමුව බස්නාහිර, වයඹ සහ උතුරු මැද පළාත්වල සියළු පොලිස් කොට්ඨාස ආවරණය කරමින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ඇතුළුව සෑම තරාතිරමකම නිලධාරීන් 2600ක ප්‍රමාණයක් දැනුවත් කර ඇත. 2026 වර්ෂය තුළ අනෙක් පළාත් සියල්ලගේම ද දැනුවත් කිරීම් වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර ඇත.

පහත සඳහන් වගුව මගින් ආරම්භයේ සිට වැඩසටහන මෙතෙක් ක්‍රියාත්මක කර ඇති පොලිස් කොට්ඨාස සහ සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව පිළිබඳ සාරාංශයක් දක්වා ඇත.

**දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇති පොලිස් කොට්ඨාස පිළිබඳ සාරාංශය**

***වගුව 01***

| අනු අංකය | පළාත | දිසාව | පොලිස් කොට්ඨාසය | ක්‍රියාත්මක කළ දින/දිනය | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | මධ්‍යම පළාත | මහනුවර | මහනුවර<br>නුවර එළිය<br>හැටන් | 2024.12.06 | 429 |
| | | මාතලේ | තෙල්දෙණිය<br>ගම්පොල | | |
| 02 | දකුණු පළාත | ගාල්ල | ගාල්ල<br>ඇල්පිටිය | 2025.01.24 | 370 |
| | | මාතර | මාතර<br>හම්බන්තොට | 2025.01.24 | 400 |
| 03 | සබරගමුව පළාත | රත්නපුර | රත්නපුර<br>ඇඹිලිපිටිය | 2025.02.07 | 275 |
| | | කෑගල්ල | කෑගල්ල<br>සීතාවකපුර | 2025.02.07 | 195 |
| 04. | බස්නාහිර පළාත | කළුතර | කළුතර<br>පානදුර | 2025.10.10 | 135 |
| | | බස්නාහිර උතුර | ගම්පහ<br>මීගමුව<br>කැළණිය | 2025.10.31 | 800 |

**මූලාශ්‍රය: මාධ්‍ය ඒකකයේ දත්ත ඇසුරිනි.**

**වැඩසටහන ක්‍රියාත්මක කිරීම පසුවිපරම් කිරීමේ වැඩපිළිවෙල**

දැනට පවත්වා අවසන් කර ඇති පොලිස් කොට්ඨාසවල සියලු පොලිස් නිලධාරීන් සතිපතා පවත්වනු ලබන උපදෙස් පන්තිවලදී මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමටත් පොලිස් ස්ථාන මට්ටමින් ගෙන ඇති පියවර සහ එහි ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන යාන්ත්‍රණය පිළිබඳව එක් එක් පළාත් සහ පොලිස් කොට්ඨාස මට්ටමින් පසුවිපරම් කරමින් ප්‍රගතිය සමාලෝචනය කර වාර්තාවක් කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට සියලුම පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් වෙත දන්වා ඇත.

## 2.1.2 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය

ජාතික පොලිස් කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේ සහ පළාත් කාර්යාලයන් හි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කර පවත්වාගෙන යාම, කොමිෂන් සභාවේ වෙබ්

අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම, කාර්ය මණ්ඩලයට අවශ්‍ය තාක්ෂණික සහය හා උපදෙස් ලබා දීම මෙම ඒකකයේ කාර්යභාරය වේ.

### 2.1.3 මාධ්‍ය ඒකකය

මෙම අංශය මගින් දිනපතා පලවන මාධ්‍ය වාර්තා පදනම් කර ගනිමින් කොමිෂන් සභාව වෙත සතිපතා වාර්තාවක් ඉදිරිපත් කරනු ලබන අතර, විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය මාධ්‍යවේදීන් සහ ආයතන සමග යහපත් සම්බන්ධතා වැඩිදියුණු කර ගැනීමට කටයුතු කරයි. එසේම කොමිෂන් සභාවේ කටයුතු සම්බන්ධයෙන් වරින්වර මාධ්‍ය නිවේදන නිකුත් කිරීමත් අවශ්‍යතාවය අනුව මාධ්‍ය සම්මන්ත්‍රණ සංවිධානය කිරීමත් මෙම ඒකකය මගින් සිදු කරනු ලැබේ.

මීට අමතරව, මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මගින් හෙලිදරව් කරන පොලිස් නිලධාරීන්ගේ සහ පොදුවේ පොලිස් සේවාවේ විෂමාචාර, නීතිය පැහැර හැරීම් සහ වෙනත් අනීතික ක්‍රියා සම්බන්ධයෙන් ජාතික පොලිස් කොමිෂන් සභාවේ අවධානයට යොමුකර ලැබෙන උපදෙස් පරිදි අවශ්‍ය ඉදිරි පියවර ගැනීම ද සිදු කරනු ලබයි.

## 2.2 මහජන පැමිණිලි විමර්ශන අංශය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 උ (2) වගන්තිය අනුව මහජනයාගෙන් ලැබෙන පැමිණිලි සහ අතෘප්තියට පත් යම් තැනැත්තෙකු විසින් පොලිස් නිලධරයකුට හෝ පොලිස් සේවයට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාරගැනීමේ හා ඒවා විමර්ශනය කිරීමේ කාර්යය පරිපාටි කොමිෂන් සභාව විසින් පිහිටුවිය යුතු අතර පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මඟින් සලසා ඇති පරිදි සහන සැලසිය යුත්තේය. කොමිෂන් සභාව විසින් සහන සැලසීමේදී පොලිස්පතිවරයාට කොමිසම විසින් ඒ බව වහාම දැනුම් දිය යුත්තේය. මෙම මහජන පැමිණිලි විමර්ශන කටයුතු ජාතික පොලිස් කොමිෂන් සභාවේ මහජන පැමිණිලි විමර්ශන අංශය විසින් සහ පළාත් නවයෙහි පිහිටුවා තිබෙන පළාත් කාර්යාල 10 මගින් සිදු කරනු ලබයි.

### 2.2.1 මහජන පැමිණිලි විමර්ශන අංශය මගින් ඉටුකරනු ලබන කාර්යයන්

- පැමිණිලි භාරගැනීම
- විමර්ශනය කිරීම.
- විමර්ශනයේදී අනාවරණය වන කරුණු අනුව පොලිස් නිලධරයෙකුගෙන් හෝ පොලිස් සේවයෙන් යම්කිසි රාජකාරි පැහැර හැරීමක් හෝ නීති විරෝධී කටයුත්තක් සිදුවී ඇති බව අනාවරණය වුවහොත් කොමිෂන් සභාවේ තීරණය අනුව අවශ්‍ය පියවර ගැනීමට පොලිස්පති හෝ අදාල බලධාරීන් වෙත යොමු කිරිම සහ ඒ අනුව අදාළ පැමිණිලිකරු දැනුවත් කිරීම.
- මහජන පැමිණිලි සම්බන්ධයෙන් පොලිසිය විසින් ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳව කොමිෂන් සභාවේ තීරණය අනුව පොලිස් නිලධාරීන් හට උපදෙස් ලබාදීම.
- මහජන පැමිණිලි විමර්ශන අංශයේ නිලධාරීන් පුහුණු කිරීම.

- කොමිෂන් සභාවට අදාළ නොවන පැමිණිලි සඳහා පැමිණිලිකරුවන්ව නිසි ආයතන වෙත යොමු කිරීම.
- 1960 ක්ෂණික ඇමතුම් සේවය මගින් පැය 24 පුරාම පැමිණිලිකරුවන්ට ක්ෂණික සහන ලබාදීම.

### 2.2.2 2025 වර්ෂය තුළ පැමිණිලි වාර්තා වීම.

- 2024 වර්ෂය තුළ දී ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත මහජන පැමිණිලි 2863 ක් වාර්තා වූ අතර එම අගය 4.5% ක වර්ධනය වීමක් පෙන්නුම් කරමින් 2025 වර්ෂය තුළ දී මහජන පැමිණිලි 2979 ක් පහත පරිදි වාර්තා වී ඇත.

**2025.01.01 සිට 2025.12.31 දක්වා පැමිණිල්ලේ ස්වභාවය අනුව පැමිණිලි වාර්තා වීම.**

*වගුව 02*

| අනු අංකය | පැමිණිල්ලේ ස්වභාවය | ලද පැමිණිලි සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| i. | පොලීසිය විසින් ක්‍රියා නොකිරීම | 827 | 27.76% |
| ii. | බලය අයථා ලෙස පරිහරණය | 575 | 19.30% |
| iii. | පක්ෂග්‍රාහී වීම | 503 | 16.88% |
| iv. | බොරු චෝදනා කිරීම | 266 | 8.93% |
| v. | මත්ද්‍රව්‍ය වැරදි | 84 | 2.82% |
| vi. | පහර දීම | 56 | 1.88% |
| vii. | අල්ලස් දූෂණ | 140 | 4.70% |
| viii. | නීති විරෝධී ලෙස රඳවා ගැනීම | 40 | 1.34% |
| ix. | වධ හිංසා පැමිණවීම | 27 | 0.91% |
| x. | කාන්තාවන්ට හා ළමුන්ට හිංසා කිරීම | 17 | 0.57% |
| xi. | පොලිස් අත්අඩංගුවේ සිටිය දී මරණය සිදු වීම | 5 | 0.17% |
| xii. | නිර්නාමික පැමිණිලි | 85 | 2.85% |
| xiii. | වෙනත් | 354 | 11.88% |
| **එකතුව** | | **2979** | 100% |

**මූලාශ්‍රය: මහජන පැමිණිලි විමර්ශන අංශයේ දත්ත ඇසුරිනි.**

- 2025 වර්ෂය තුළ දී වාර්තා වී ඇති මහජන පැමිණිලි වල ස්වභාවය අනුව වර්ගීකරණය කර විශ්ලේෂණය කිරීමේ දී **පොලීසිය විසින් ක්‍රියා නොකිරීම, බලය අයථා ලෙස පරිහරණය සහ පක්ෂග්‍රාහී වීම** යන උපවර්ග යටතේ වාර්තා වී ඇති පැමිණිලි වල ඉතා ඉහළ ප්‍රවණතාවයක් නිරීක්ෂණය වේ.

### 2.2.3 2025 වර්ෂයේ සමස්ථ විමර්ශන අවසන් කිරීමේ ප්‍රගතිය.

*වගුව **03***

| වර්ෂය තුළ මහජන පැමිණිලි විමර්ශන ප්‍රගතිය - 2025.01.01-2025.12.31 | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | පළාත / කාර්යාලය | **2024.12.31** වන දින වන විට විමර්ශනය කිරීමට පැවති මුළු පැමිණිලි සංඛ්‍යාව | **2025** වර්ෂය තුළ ලද පැමිණිලි සංඛ්‍යාව | **2024.12.31** දින වන විට පැවති පැමිණිලි සංඛ්‍යාවේ සහ **2025** වර්ෂය තුළ ලද පැමිණිලි සංඛ්‍යාවේ එකතුව | **2025** වර්ෂය තුළ විමර්ශන අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව | **2025** වර්ෂය තුළ විමර්ශන අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව මුළු පැමිණිලි සංඛ්‍යාවේ ප්‍රතිශතයක් | **2025.12.31** දින වන විට විමර්ශනය කිරීමට පවතින පැමිණිලි සංඛ්‍යාව | **2025.12.31** දින වන විට විමර්ශනය කිරීමට පවතින පැමිණිලි සංඛ්‍යාව මුළු පැමිණිලි සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස |
| 1 | බස්නාහිර I | 1303 | 787 | 2090 | 758 | 36.27% | 1332 | 63.73% |
| 2 | බස්නාහිර II | 574 | 525 | 1099 | 595 | 54.14% | 504 | 45.86% |
| 3 | දකුණ | 743 | 423 | 1166 | 667 | 57.20% | 499 | 42.80% |
| 4 | වයඹ | 451 | 270 | 721 | 315 | 43.69% | 406 | 56.31% |
| 5 | මධ්‍යම | 451 | 210 | 661 | 457 | 69.14% | 204 | 30.86% |
| 6 | සබරගමුව | 398 | 248 | 646 | 328 | 50.77% | 318 | 49.23% |
| 7 | උතුරුමැද | 291 | 114 | 405 | 255 | 62.96% | 150 | 37.04% |
| 8 | ඌව | 294 | 164 | 458 | 203 | 44.32% | 255 | 55.68% |
| 9 | නැගෙනහිර | 220 | 101 | 321 | 187 | 58.26% | 134 | 41.74% |
| 10 | උතුර | 153 | 115 | 268 | 180 | 67.16% | 88 | 32.84% |
| 11 | විශේෂ ගොනු (ප්‍ර.කා) | 24 | 22 | 46 | 31 | 67.39% | 15 | 32.61% |
| | **එකතුව** | **4902** | **2979** | **7881** | **3976** | **50.45%** | **3905** | **49.55%** |

මූලාශ්‍රය: මහජන පැමිණිලි විමර්ශන අංශයේ දත්ත ඇසුරිනි.

### 2.2.4 පසුගිය වසරට සාපේක්ෂව විමර්ශන අවසන් කිරීමේ ප්‍රගතිය සංසන්දනය -

**A - සමස්ථ විමර්ශන ප්‍රගතිය**

*වගුව **04***

| වාර්ෂික විමර්ශන ප්‍රගතිය සංසන්දනාත්මකව | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| **2024 වර්ෂය තුළ සමස්ථ විමර්ශන ප්‍රගතිය** | | | | | **2025 වර්ෂය තුළ සමස්ථ විමර්ශන ප්‍රගතිය** | | | | |
| **2024.01.01** දිනට විමර්ශනය කිරීමට පැවති | ලැබීම සංඛ්‍යාව | **2024** වර්ෂය ආරම්භයේ ඉතිරිව පැවති පැමිණිලි සංඛ්‍යාවේ සහ වර්ෂය තුළ ලද පැමිණිලි සංඛ්‍යාවේ එකතුව | විමර්ශන අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව | විමර්ශන අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස | **2025.01.01** දිනට විමර්ශනය කිරීමට පැවති සංඛ්‍යාව | ලැබීම සංඛ්‍යාව | **2025** වර්ෂය ආරම්භයේ ඉතිරිව පැවති පැමිණිලි සංඛ්‍යාවේ සහ වර්ෂය තුළ ලද පැමිණිලි සංඛ්‍යාවේ එකතුව | විමර්ශන අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව | විමර්ශන අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස |
| 3072 | 2863 | 5935 | 1033 | 17.41% | 4902 | 2979 | 7881 | 3976 | 50.45% |

මූලාශ්‍රය: මහජන පැමිණිලි විමර්ශන අංශයේ දත්ත ඇසුරිනි.

**B - වර්ෂය තුළ ලද පැමිණිලි විමර්ශන ප්‍රගතිය සංසන්දනාත්මකව.**

*වගුව 05*

| **2024.01.01 වන දින සිට 2024.12.31 වන දිනය දක්වා එම වර්ෂය තුළ ලද පැමිණිලි විමර්ශන ප්‍රගතිය** | | | **2025.01.01 වන දින සිට 2025.12.31 වන දිනය දක්වා එම වර්ෂය තුළ ලද පැමිණිලි විමර්ශන ප්‍රගතිය** | | |
|---|---|---|---|---|---|
| ලැබීම් සංඛ්‍යාව | ඉන් විමර්ශන අවසන් කල සංඛ්‍යාව | විමර්ශන අවසන් කිරීමේ ප්‍රතිශතය | ලැබීම් සංඛ්‍යාව | ඉන් විමර්ශන අවසන් කල සංඛ්‍යාව | විමර්ශන අවසන් කිරීමේ ප්‍රතිශතය |
| 2863 | 335 | 11.70% | 2979 | 1219 | 40.92% |

**මූලාශ්‍රය: මහජන පැමිණිලි විමර්ශන අංශයේ දත්ත ඇසුරිනි.**

## 2.2.5 1960 ක්ෂණික ඇමතුම් සේවය

මහජනතාවට ජාතික පොලිස් කොමිෂන් සභාවට පැමිණිලි ඉදිරිපත් කිරීමට පහසුවනු පිණිස WhatsApp පහසුකම් සහිතව 0710361010 දරන ජංගම දුරකථන අංකය සමඟ අංක හතරකින් යුත් දවසේ පැය 24 පුරාම ක්‍රියාත්මක වන මහජන ඇමතුම් අංකයක් (Hot Line) ලෙස 1960 ක්ෂණික ඇමතුම් සේවය ක්‍රියාත්මක වේ.

ඒ අනුව දවසේ ඕනෑම වේලාවක මහජනතාවට නාමිකව හෝ නිර්ණාමිකව පැමිණිලි ඉදිරිපත් කළ හැකි අතර එම පැමිණිල්ල ස්වයංක්‍රීයව පටිගතවේ. ඒ සම්බන්ධයෙන් විමර්ශන නිලධාරී විසින් අදාල පියවර ගන්නා අතර පැමිණිලිකරුගේ රහස්‍යභාවය සුරක්ෂිත වන ආකාරයට කටයුතු කර ඉදිරි පියවරයන් සඳහා යොමු කරනු ඇත.

**2025.01.01 වන දින සිට 2025.12.31 දින දක්වා 1960 ක්ෂණික ඇමතුම් සේවය වෙත ලද ඇමතුම්** *වගුව 06*

| (1) | (2) | | | (3) | | | | (4) | (5) | (6) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාසය | මහජන පැමිණිලි - 1960 ක්ෂණික ඇමතුම් සේවය | | | පොලිස් නිලධාරීන්ගේ විමසීම් | | | | කොමිෂන් සභා විෂය පථයට අදාළව ලැබුණු පැමිණිලි / විමසීම් සංඛ්‍යාව | මහජනයා විසින් වෙනත් ආයතන සම්බන්ධයෙන් විමසීම් කරන ලද සංඛ්‍යාව | 1960 ක්ෂණික ඇමතුම් දුරකථන සේවය වෙත ලැබුණු මුළු ඇමතුම් සංඛ්‍යාව |
| | (I) | (II) | (III) | (I) | (II) | (III) | (IV) | | | |
| | පොලිස් ස්ථානාධිපති/ පොලිස් අධිකාරී සහ වෙනත් අදාළ ආයතන වෙත ඉදිරිපත් කර ක්ෂණිකව සහන ලබා දුන් සංඛ්‍යාව | ක්ෂණිකව සහන ලබා දිය නොහැකි ගැටළු සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සම්බන්ධයෙන් උපදෙස් ලබා දුන් සංඛ්‍යාව | මුළු සංඛ්‍යාව (2.I) + (2.II) | අභියාචනා අංශය | ආයතන හා විනය අංශය | AAT අංශය | මුළු සංඛ්‍යාව (3.I) + (3.II) + | (2+3) | | (4+5) |
| ජනවාරි | 87 | 584 | 671 | 754 | 10 | 13 | 777 | 1448 | 487 | 1935 |
| පෙබරවාරි | 74 | 418 | 492 | 465 | 4 | 9 | 478 | 970 | 428 | 1398 |
| මාර්තු | 38 | 414 | 452 | 503 | 9 | 9 | 521 | 973 | 347 | 1320 |
| අප්‍රේල් | 39 | 337 | 376 | 397 | 1 | 2 | 400 | 776 | 472 | 1248 |
| මැයි | 57 | 314 | 371 | 407 | 3 | 5 | 415 | 786 | 480 | 1266 |
| ජූනි | 58 | 370 | 428 | 386 | 4 | 10 | 400 | 828 | 544 | 1372 |
| ජූලි | 73 | 369 | 442 | 385 | 11 | 5 | 401 | 843 | 632 | 1475 |
| අගෝස්තු | 50 | 353 | 403 | 398 | 8 | 11 | 417 | 820 | 621 | 1441 |
| සැප්තැම්බර් | 33 | 408 | 441 | 489 | 7 | 10 | 506 | 947 | 540 | 1487 |
| ඔක්තෝබර් | 59 | 391 | 450 | 316 | 6 | 9 | 331 | 781 | 549 | 1330 |
| නොවැම්බර් | 47 | 313 | 360 | 176 | 11 | 11 | 198 | 558 | 551 | 1109 |
| දෙසැම්බර් | 34 | 325 | 359 | 277 | 12 | 2 | 291 | 650 | 622 | 1272 |
| එකතුව | **649** | **4596** | **5245** | **4953** | **86** | **96** | **5135** | **10380** | **6273** | **16653** |

**මූලාශ්‍රය: මහජන පැමිණිලි විමර්ශන අංශයේ දත්ත ඇසුරිනි.**

## 2.3 අභියාචනා අංශය

### 2.3.1 අභියාචනා අංශයේ කාර්යයන්

ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ඊට පහළ තනතුරු දරණ නිලයන්ට අදාළ අභියාචනා ලද පසු ඒවා ලේඛනගත කිරීම, පොලිස්පති වෙතින් වාර්තා කැඳවීම, කොමිෂන් පත්‍රිකා සකස් කිරීම හා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම, ඉල්ලීම් කර ඇති පාර්ශවයන්ට අදාළ පරිදි තොරතුරු නිකුත් කිරීම. (උදා:-ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් කාරක සභාව/තොරතුරු පනතට අදාළව)

### 2.3.2 අභියාචනා වර්ග

i. සේවය හැර ගිය නිලධාරීන් නැවත සේවයේ පිහිටුවීම සම්බන්ධ අභියාචනා
ii. වැඩ තහනම් කරන ලද නිලධාරීන් නැවත සේවයේ පිහිටුවීම සම්බන්ධ අභියාචනා
iii. පත්වීම අවලංගු කරන ලද නිලධාරීන් නැවත සේවයේ පිහිටුවීම සම්බන්ධ අභියාචනා
iv. උසස්වීම් ලබා ගැනීම, උසස්වීම් පෙරදාතම කිරීම සහ වැරදි ලෙස සිදු කරන ලද උසස්වීම් වලට එරෙහි අභියාචනා.
v. විනය නියෝගයට එරෙහි අභියාචනා.
vi. ස්ථාන මාරු ලබා ගැනීම, ස්ථාන මාරු අවලංගු කරවා ගැනීම සම්බන්ධ අභියාචනා.
vii. විශ්‍රාම ගැන්වීම සම්බන්ධ අභියාචනා.
viii. නැවත සේවයේ පිහිටුවීමේ දී ලබා දුන් කොන්දේසි සංශෝධනය කිරීම සම්බන්ධ අභියාචනා.
ix. පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ පත්වීම්, ස්ථාන මාරුවීම් හා විනය ක්‍රියා මාර්ගවලට අදාළ රාජකාරී.
x. කොන්ත්‍රාත් පදනම මත ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන්හි නිලධාරීන් නැවත සේවයට බඳවා ගැනීමට අදාළ රාජකාරී.

**2025.01.01 දින සිට 2025.12.31 වන දින දක්වා අංශයේ කටයුතු පිළිබඳ සංඛ්‍යාත්මක දත්ත**

***වගුව 07***

| | | |
|---|---|---|
| i. | 2025.01.01 අභියාචනා අංශයේ පැවති අභියාචනා සංඛ්‍යාව | 4368 |
| ii. | 2025.01.01 දින සිට 2025.12.31වන දින දක්වා කාලය තුළ ජාතික පොලිස් කොමිෂන් සභාවට ලැබී ඇති අභියාචනා සංඛ්‍යාව | 3283 |
| iii. | එකතුව | 7651 |
| iv. | 2025 වර්ෂය තුළ තීරණ ලබා දී ඇති අභියාචනා සංඛ්‍යාව | 4064 |
| v. | 2025.12.31 දිනට අභියාචනා අංශය තුළ ක්‍රියාකරමින් පවතින අභියාචනා සංඛ්‍යා | 3587 |

**මූලාශ්‍රය: අභියාචනා අංශයේ දත්ත ඇසුරිනි.**

**රාජකාරී විෂයට අදාළව 2025.01.01 දින සිට 2025.12.31 වන දින දක්වා අභියාචනා අංශය තුළ ක්‍රියාකරමින් පවතින අභියාචනා සංඛ්‍යාව සහ එහි ප්‍රගතිය**

*වගුව **08***

| කාරණය | 2025.01.01 දිනට පැවති අභියාචනා සංඛ්‍යාව | 2025.01.01 දින සිට 2025.12.31 වන දින දක්වා ලද අභියාචනා සංඛ්‍යාව | 2025 වර්ෂය තුළ ක්‍රියා කිරීමට පැවති මුළු අභියාචනා සංඛ්‍යාව | 2025.01.01 දින සිට 2025.12.31 වන දින දක්වා තීරණ ලබා දුන් අභියාචනා සංඛ්‍යාව | 2025.12.31 දින දක්වා තීරණ ලබා දුන් අභියාචනා සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස | 2025.12.31 දිනය වන විට ක්‍රියා කිරීමට පවතින අභියාචනා සංඛ්‍යාව | 2025.12.31 වන දිනට ක්‍රියා කිරීමට පවතින අභියාචනා සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|---|
| තනතුර හැරයාම සම්බන්ධ (VOP) | 773 | 516 | 1289 | 808 | 62.68% | 481 | 37.32% |
| වැඩ තහනම්ව නැවත සේවයේ පිහිටුවීම (INT) | 399 | 242 | 641 | 219 | 34.17% | 422 | 65.83% |
| පත්වීම් අවලංගුවීම (TER) | 58 | 85 | 143 | 69 | 48.25% | 74 | 51.75% |
| උසස් කිරීම (PRO) | 992 | 1371 | 2363 | 1433 | 60.64% | 930 | 39.36% |
| විනය නියෝග සංශෝධනය (DIS) | 1342 | 223 | 1565 | 651 | 41.60% | 914 | 58.40% |
| ස්ථාන මාරුවීම් (TRA) | 496 | 686 | 1182 | 671 | 56.77% | 511 | 43.23% |
| විශ්‍රාම වැටුප (RET) | 103 | 84 | 187 | 88 | 47.06% | 99 | 52.94% |
| වෙනත් (OTHER) | 205 | 76 | 281 | 125 | 44.48% | 156 | 55.52% |
| එකතුව | **4368** | **3283** | **7651** | **4064** | **53.12%** | **3587** | **46.88%** |

**මූලාශ්‍රය: අභියාචනා අංශයේ දත්ත ඇසුරිනි.**

**පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ ස්ථානමාරුවීම් / විනයානුකූලව කටයුතු කිරිම/කොන්ත්‍රාත් පදනම මත සේවා දිගුවක් ලබා දීම සම්බන්ධ ප්‍රගතිය**

*වගුව 09*

| රාජකාරී විෂය | 2025.01.01. දිනට පැවති වාර්තා සංඛ්‍යාව | 2025.01.01 දින සිට 2025.12.31 වන දින දක්වා ලද වාර්තා සංඛ්‍යාව | 2025 වර්ෂය තුළ ක්‍රියා කිරීමට පැවති මුළු අභියාචනා සංඛ්‍යාව | 2025.01.01 දින සිට 2025.12.31 වන දින දක්වා ඉදිරිපත් කළ කොමිෂන් පත්‍රිකා තුල වූ වාර්තා සංඛ්‍යාව | 2025.12.31 දින දක්වා තීරණ ලබා දුන් වාර්තා සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස | 2025.12.31 දිනය වන විට ක්‍රියා කිරීමට පවතින වාර්තා සංඛ්‍යාව | 2025.12.31 වන දිනට ක්‍රියා කිරීමට පවතින අභියාචනා සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|---|
| කොන්ත්‍රාත් පදනම මත සේවා දිගුවක් ලබා ගැනීම සඳහා (RET CON) | 10 | 15 | 25 | 25 | 100% | 0 | 0% |
| ස්ථානාධිපති වරුන්ගේ ස්ථානමාරුවීම් (OIC TRA) | 10 | 172 | 182 | 170 | 93% | 12 | 07% |
| පොලිස් ස්ථානාධිපති වරුන්ගේ විනය සම්බන්ධව (OIS DIS) | 232 | 311 | 543 | 220 | 41% | 323 | 59% |
| **එකතුව** | **252** | **498** | **750** | **415** | **55%** | **335** | **45%** |

**මූලාශ්‍රය: අභියාචනා අංශයේ දත්ත ඇසුරෙනි.**

## 2.4 ආයතන හා විනය අංශය

ශ්‍රී ලංකා පොලිසියේ රාජ්‍ය නිවේදිත නිලධාරීන් වන සහකාර පොලිස් අධිකාරී තනතුරේ සිට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුරු දක්වා වන නිලධාරීන්ගේ ආයතනික කටයුතු එනම් බඳවා ගැනීම්, පත් කිරීම්, උසස් කිරීම් , ස්ථාන මාරු කිරීම්, සේවය ස්ථිර කිරීම්, වැඩ බැලීම/රාජකාරී ඉටු කිරීමට පත් කිරීම්, විශ්‍රාම ගැන්වීම්, බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි සකස් කිරීම,ද්විතීයින පදනම මත වෛද්‍යවරුන් බඳවා ගැනීම ආදී කටයුතු මෙන්ම විනය පාලනය හා සේවයෙන් පහ කිරීම සම්බන්ධ සියළු කටයුතු ආයතන හා විනය අංශයෙන් සිදු කරනු ලබයි.

එසේම, ආයතන හා විනය අංශය විසින් රාජ්‍ය නිවේදිත නිලධාරී කාණ්ඩයට අයත් වන සහකාර පොලිස් අධිකාරී තනතුරේ සිට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුර දක්වා තනතුරු දරන සියලු නිලධාරීන් විසින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන අභියාචනා සම්බන්ධ රාජකාරී කටයුතු ද සිදු කරනු ලබයි.

### 2.4.1 ආයතන හා විනය අංශයට පැවරී ඇති කාර්යයන්

- ශ්‍රී ලංකා පොලිසියේ සාමාන්‍ය සහ විශේෂ කාර්ය බලකාය රාජ්‍ය නිවේදිත නිලධාරීන් වන සහකාර පොලිස් අධිකාරී තනතුරේ සිට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුරු දක්වා වන නිලධාරීන්ගේ පත් කිරීම්, උසස් කිරීම් හා පෙරදාතම් කිරීම් සම්බන්ධව කටයුතු කිරීම
- රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ ස්ථාන මාරු සම්බන්ධව කටයුතු කිරීම.
- රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීම්, සේවයේ ස්ථිර කිරීම, විනය ක්‍රියාමාර්ග පවතින නිලධාරීන්ගේ විදේශ නිවාඩු අනුමත කිරීම, විශ්‍රාමලත් නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත සේවයේ පිහිටුවීම සම්බන්ධව කටයුතු කිරීම.
- රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ විනය සම්බන්ධව කටයුතු කිරීම
- දේශපාලන පලිගැනීම්වලට ලක් වූ රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ අභියාචනා පිළිබඳව වූ සියලු කටයුතු සිදු කිරීම.
- ශ්‍රී ලංකා පොලිසියේ රාජ්‍ය නිවේදිත නිලධාරීන්ට අදාළ බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටි සකස් කිරීම.

**2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා ආයතන හා විනය අංශයේ ප්‍රගතිය**

*වගුව 10*

| අනු අංකය | විස්තරය | ලැබී ඇති අභියාචනා සංඛ්‍යාව | ලබා දුන් තීරණ සංඛ්‍යාව | දෙසැම්බර් මස 31 දිනට ක්‍රියාත්මක කරමින් පවතින මුළු ගොනු | වසර තුළ ක්‍රියාත්මක කළ ගොනු වලින් අවසන් කළ ගොනු ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|---|
| 1 | **උසස් වීම් /පෙරදාතම් අභියාචනා** | | | | |
| | i. සහකාර පොලිස් අධිකාරී | 185 | 169 | 16 | **91** |
| | ii. පොලිස් අධිකාරී | 123 | 112 | 11 | **91** |
| | iii. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී | 76 | 73 | 3 | **96** |
| | iv. නියෝජ්‍ය පොලිස්පති | 89 | 85 | 4 | **96** |
| | v. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති | 3 | 1 | 2 | **33** |
| 2 | **ස්ථාන මාරුවීම්** | | | | |
| | i. සහකාර පොලිස් අධිකාරී | 158 | 158 | **-** | **100** |
| | ii. පොලිස් අධිකාරී | 16 | 16 | **-** | **100** |
| | iii. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී | 113 | 113 | **-** | **100** |
| | iv. නියෝජ්‍ය පොලිස්පති | 38 | 38 | **-** | **100** |
| | iii. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති | 39 | 39 | **-** | **100** |
| | වෙනත් ස්ථාන මාරු අභියාචනා | 20 | 20 | **-** | **100** |
| 3 | **ස්ථිර කිරීම්** | | | | |
| | i. සහකාර පොලිස් අධිකාරී | 52 | 52 | - | **100** |
| 4 | **රාජකාරි ඉටුකිරීම සඳහා පත් කිරීම** | | | | |
| | i. සහකාර පොලිස් අධිකාරී | - | - | - | |
| | ii. පොලිස් අධිකාරී | - | - | - | |
| | iii. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී | 3 | 3 | - | **100** |
| | iv. නියෝජ්‍ය පොලිස්පති | 10 | 8 | 2 | **80** |
| | v. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති | 4 | 4 | - | **100** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 5 | **ස.පො.අ.සේවයේ පරිවාස කාලය දීර්ඝ කිරීම** | | | | |
| | i. සහකාර පොලිස් අධිකාරී | 51 | 51 | - | **100** |
| 6 | **විශ්‍රාම ගැන්වීම්** | | | | |
| | i. සහකාර පොලිස් අධිකාරී | 23 | 22 | 1 | **96** |
| | ii. පොලිස් අධිකාරී | 15 | 15 | - | **100** |
| | iii. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී | 39 | 35 | 4 | **90** |
| | iv. නියෝජ්‍ය පොලිස්පති | 2 | 1 | 1 | **50** |
| | v. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති | 1 | 1 | - | **100** |
| **7** | **නිලධාරීන් ද්වීතීයික පදනම මත මුදා හැරීම** | | | | |
| | සහකාර පොලිස් අධිකාරී | 3 | 3 | - | **100** |
| | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී | 2 | 2 | - | **100** |
| **8** | **විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම** | | | | |
| | නියෝජ්‍ය පොලිස්පති | 1 | 1 | - | **100** |
| | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී | 1 | 1 | - | **100** |
| | පොලිස් අධිකාරී | 5 | 5 | - | **100** |
| **9** | **වෙනත් පොදු ඉල්ලීම්** | | | | |
| | පොලිස්අධිකාරී (වෛද්‍ය නිලධාරීන්) | 5 | 5 | - | **100** |
| | එකතුව | **1,077** | **1,033** | **44** | **96** |

මූලාශ්‍රය: ආයතන හා විනය අංශයේ දත්ත ඇසුරෙනි.

## විනය කටයුතු - 2025.01.01 සිට 2025.12.31 දක්වා

*වගුව 11*

| වර්ෂය | වර්ෂය තුල ලද මුලු විනය ගොනු ගණන | අදාල වර්ෂය තුළදී අවසන් කළ විනය ගොනු සංඛ්‍යාව | 2025.12.31 දින වන විට අවසන් කළ මුළු ගොනු සංඛ්‍යාව | 2025.12.31 දිනට ඉතිරි සංඛ්‍යාව | අදාල වර්ෂය තුළ අවසන් කරන ලද ගොනු සංඛ්‍යාවෙහි ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| **2023** | 150 | 53 | 118 | 32 | 35 % |
| **2024** | 53 | 7 | 36 | 17 | 13 % |
| **2025** | 144 | 76 | 76 | 68 | 53 % |
| එකතුව | **347** | **136** | **230** | **117** | |

මූලාශ්‍රය: ආයතන හා විනය අංශයේ දත්ත ඇසුරෙනි.

## ආයතනික කටයුතු

*වගුව 12*

| වර්ෂය | වර්ෂය තුල ලද මුලු ගොනු ගණන | අදාල වර්ෂය තුළදී අවසන් කළ ගොනු සංඛ්‍යාව | අදාල වර්ෂය තුළ අවසන් කරන ලද ගොනු සංඛ්‍යාවෙහි ප්‍රතිශතය |
|---|---|---|---|
| 2023 | 911 | 762 | 84 % |
| 2024 | 1018 | 926 | 91 % |
| 2025 | 1167 | 1123 | 96 % |
| එකතුව | **3096** | **2811** | |

මූලාශ්‍රය: ආයතන හා විනය අංශයේ දත්ත ඇසුරෙනි.

## 2.5 අභ්‍යන්තර විගණන ඒකකය

ජාතික පොලිස් කොමිෂන් සභාව සඳහා අනුමත කාර්ය මණ්ඩලය තුල පවතින ශ්‍රී.ලං.ග.සේ. II/III තනතුරක් වන අභ්‍යන්තර විගණක තනතුර සඳහා මෙතෙක් නිලධරයෙකු පත්කර නොමැති අතර ඒ සඳහා සුදුසු නිලධරයෙකු අනුයුක්ත කර දෙන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් වෙත නොයෙක් අවස්ථාවන් හිදී දැනුම් දී ඇතත් මේ දක්වා නිලධරයෙකු අනුයුක්ත කර නොමැති බැවින් අභ්‍යන්තර විගණක අංශයක් ස්ථාපිතව නැත.

එසේ වුවද 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 41 වන වගන්තිය හා DMA/2/2019 හා 2019.01.12 දිනැති කළමනාකරණ විගණන චක්‍රෙල්ඛය පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් විගණන කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේද සහභාගීත්වයෙන් නියමිත පරිදි පවත්වාගෙන යනු ලැබේ. 2025.12.31 දින වන විට කාර්තු රැස්වීම් හතරක් පවත්වා ඇත.

## 2.6 නීති ඒකකය

නීති අංශය වෙත ලැබී ඇති ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් අයදුම්පත් හා අභියාචනාධිකරණ රිට් අයදුම්පත්වලට අදාලව නීතිපති දෙපාර්තමේන්තුව වෙත නිරීක්ෂණ වාර්තා සකස් කර ජාතික පොලිස් කොමිෂන් සභාවේ අනුමැතිය අනුව, නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම හා ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් අයදුම්පත් හා අභියාචනාධිකරණ රිට් අයදුම්පත් සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව මඟින් ඉල්ලුම් කරන ලද තොරතුරු/ වාර්තාවලට අදාලව තොරතුරු/ වාර්තා සකස් කර ජාතික පොලිස් කොමිෂන් සභාවේ අනුමැතිය අනුව, නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම, නීති අංශයේ ප්‍රධානතම කාර්යය වේ. ඊට අමතරව, ජාතික පොලිස් කොමිෂන් සභාවේ විෂය පථයට අදාලව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇති සියළුම අභියාචනා ගොනු සම්බන්ධයෙන් කටයුතු කිරීම ද සිදු කරනු ලබයි.

## 2.6.1 නීති අංශයේ ප්‍රගතිය

**2025.12.31 වන විට නීති අංශය විසින් අවසන් කර ඇති නඩු ගොනු පිළිබඳ විස්තර**

*වගුව 13*

| වර්ෂය | 2025.01.01 දිනට ක්‍රියාකාරී ගොනු සංඛ්‍යාව | 2025.09.30 දිනට ලද ගොනු සංඛ්‍යාව | 2025.09.30 දිනට අවසන් ගොනු සංඛ්‍යාව | 2025.09.30දිනට ක්‍රියාකාරී ගොනු සංඛ්‍යාව | ගරු ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය මඟින් තීන්දු ලබා දී ඇති ගොනු සංඛ්‍යාව (Judgment Delivered) | තීන්දුව ලබා දීමට නියමිත (Judgment Reserved) ගොනු සංඛ්‍යාව | 2025.09.30 දිනට ක්‍රියාකාරී ගොනු සංඛ්‍යාව | 2025.09.30 දින සිට 2025.12.31 දිනට ලද ගොනු සංඛ්‍යාව | 2025.09.30 දින සිට 2025.12.31 දිනට අවසන් කරන ලද ගොනු සංඛ්‍යාව | 2025.12.31 දිනට ක්‍රියාකාරී ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2008 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 0 | | | 0 |
| 2009 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 0 | | | 0 |
| 2010 | 2 | 0 | 0 | 2 | 1 | 0 | 1 | 1 | 1 | 1 |
| 2011 | 2 | 0 | 0 | 2 | 1 | 1 | 0 | | | 0 |
| 2012 | 2 | 0 | 2 | 0 | 0 | 0 | 0 | | | 0 |
| 2013 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | | | 0 |
| 2014 | 2 | 0 | 1 | 1 | 1 | 0 | 0 | | | 0 |
| 2015 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 0 | | | 0 |
| 2016 | 8 | 0 | 1 | 7 | 3 | 0 | 3+1 (Relisting) | | | 4 |
| 2017 | 3 | 0 | 1 | 2 | 1 | 1 | 0 | | | 0 |
| 2018 | 9 | 1 | 0 | 10 | 2 | 7 | 1 | | | 1 |
| 2019 | 24 | 1 | 15 | 10 | 3 | 2 | 5 | | | 5 |
| 2020 | 54 | 1 | 5 | 50 | 12 | 8 | 30 | 2 (Relisting) | 3+1 (Relisting) | 27+1 (Relisting) |
| 2021 | 18 | 1 | 0 | 19 | 5 | 8 | 6 | | | 6 |
| 2022 | 12 | 1 | 4 | 9 | 3 | 0 | 6 | | | 6 |
| 2023 | 28 | 1 | 2 | 27 | 5 | 15 | 7 | | | 7 |
| 2024 | 21 | 1 | 1 | 21 | 7 | 0 | 14 | 2+1 (Relisting) | 1 (Relisting) | 16 |
| 2025 | 0 | 19 | 0 | 19 | 4 | 0 | 15 | 37 | 3 | 49 |
| | 192 | 28 | 36 | 184 | 50 | 45 | 89 | 43 | 9 | **123** |

**මූලාශ්‍රය: නීති ඒකකයේ දත්ත ඇසුරෙනි.**

මෙම ගොනු 123න් ගොනු 31ක් සම්බන්ධිත ගොනු වේ

නීති අංශය සතුව 2025.01.01 දිනට ක්‍රියාකාරී ගොනු 192 ක් පැවති අතර 2025.12.31 ගොනු 70 ක කටයුතු අවසන්ව ක්‍රියාකාරී ගොනු සංඛ්‍යාව 123 පැවතුනි. ඒ අනුව, ගොනු අවසන් කිරීමට අදාලව 36% ක ප්‍රගතියක් නීති අංශය ලබා ඇත.

කෙසේ වෙතත්, නීති අංශයේ ගොනු විවෘත කිරීම, ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ලැබෙන ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් අයදුම්පත් හා අභියාචනාධිකරණ රිට් අයදුම්පත් ප්‍රමාණය මත සහ ගොනු අවසන් කිරීම, ගරු ශ්‍රේෂ්ඨාධිකරණය හා ගරු අභියාචනාධිකරණය විසින් ලබා දෙන තීන්දු මත පදනම් වේ.

## 2.7 පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය (AAT)

**පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය විසින් එක් එක් වර්ෂයන්හි ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන ලද අභියාචනා සම්බන්ධ සවිස්තර වාර්තාව**

*වගුව **14***

| අනු අංකය | වර්ෂය | පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙතින් ලද මුළු ගොනු | | 2025.01.01 දිනට ක්‍රියා කිරීමට තිබූ මුළු ගොනු | 2025.01.01 දින සිට 2025.12. දක්වා විවෘත කළ ගොනු | 2025.01.01 සිට 2025.12.31 නියෝග ලද බැඩි අවසන් ගොනු | පො.කො.ස. විසින් නිරීක්ෂණ ලබා දී ඇති නමුත් ප.වි.අ. විසින් තීරණ ලබා දී නොමැති | ක්‍රියා කිරීමට ඇති සම්පූර්ණ ගොනු | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් | සෘජුවම ජා.පො. කො.සභාව වෙත ලද ගොනු | | | | | නිරීක්ෂණ ලබා දීමට ඇති ගොනු | ප්‍රතිශත | ක්‍රියා කිරීමට ඇති සම්පූර්ණ ගොනු |
| 01 | 2012 | 01 | | - | - | - | | | | - |
| 02 | 2013 | 01 | | - | - | - | | | | - |
| 03 | 2014 | 02 | | 01 | - | 01 | | - | 100% | - |
| 04 | 2015 | 02 | | - | - | - | - | - | 100% | - |
| 05 | 2016 | 03 | | 02 | - | 02 | - | - | 100% | - |
| 06 | 2017 | 20 | | 18 | - | 17 | 01 | - | 100% | 01 |
| 07 | 2018 | 88 | | 74 | - | 54 | 20 | - | 100% | 20 |
| 08 | 2019 | 193 | | 112 | - | 72 | 40 | - | 100% | 40 |
| 09 | 2020 | 215 | | 206 | - | 156 | 50 | - | 100% | 50 |
| 10 | 2021 | 37 | | 29 | - | 16 | 13 | - | 100% | 13 |
| 11 | 2022 | 40 | | 79 | - | 45 | 34 | - | 100% | 34 |
| | 2022 | | 46 | | | | | | | |
| 12 | 2023 | | 58 | 58 | - | 32 | 22 | 04 | 93% | 26 |
| 13 | 2024 | | 251 (119*) | 251 (119) | 22<br>251+22= 273-132=<br>141+3= 144 | 49 | 30 | 65 | 54% | 95 |
| 14 | 2025 | | | - | 285 | 43 | 18 | 224 | 21% | 242 |
| | මුළු එකතුව | **602** | **355** | **830** | **579+144+285= 1008** | **487** | **228** | **293** | **70%** | **521** |

මුලාශ්‍රය : නීති අංශයේ දත්ත ඇසුරින්

## 2.8 ගිණුම් / මූල්‍ය අංශය

රජයේ මුදල් රෙගුලාසිවලට අනුකූලව ගිණුම් පවත්වාගෙන යාම සහ ඊට සම්බන්ධ අනෙකුත් කාර්යයන් ඉටු කිරීම ගිණුම් අංශය සතු කාර්යභාරයයි. ඒ අනුව ජාතික පොලිස් කොමිෂන් සභාවේ කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීමට මහා භාණ්ඩාගාරය සමඟ සෘජුවම කටයුතු කිරීම මෙම අංශයට පැවරී ඇත. අයවැය මඟින් වෙන් කර ඇති අරමුදල් මූල්‍ය අවශ්‍යතාවය මත ලබාදීම එහිදී සිදු කරනු ලබයි. අරමුදල් කළමනාකරණය, වියදම් පාලනය, කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයට සහ පළාත් කාර්යාල 10 සඳහා අවශ්‍ය වට්ටෝරු භාණ්ඩ, කාර්යාල උපකරණ හා ලිපි ද්‍රව්‍ය සැපයීම මෙම අංශයට පැවරී ඇති කාර්යභාරයකි. මීට අමතරව පොලිස් කොමිෂන් සභාවේ සේවය කරන විවිධ සේවාවලට අයත් නිලධාරින්ගේ වැටුප් ගෙවීම සහ අනෙකුත් වැය දැරීම් පිළිබඳ රාජකාරී ඉටු කිරීම ද මෙම අංශයේ තවත් වගකීමකි.

## 2.9 2025 වර්ෂය තුළ ජාතික පොලිස් කොමිෂන් සභාවේ විශේෂ ජයග්‍රහණ, අභියෝග සහ ඉදිරි ඉලක්ක

ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් 2023.07.20 දිනැති අංක 2341/45 ගැසට් නිවේදනය මඟින් ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලයට පහළ නිලයන් දරණ පොලිස් නිලධරයන් (පොලිස් ස්ථානාධිපතිවරුන් සහ ක්‍රියාකාරී කොට්ඨාශවල ස්ථානාධිපතිවරුන් හැර) පත් කිරීමේ, උසස් කිරීමේ, විනය පාලනය කිරීමේ හා සේවයෙන් පහකිරීමේ බලය පොලිස්පතිවරයා සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධරයන් වෙත අභිනියෝජනය කරන ලද බලතල සම්බන්ධයෙන් කරනු ලැබූ යම් නියෝගයක් හේතුකොට ගෙන අතෘප්තියට පත්වන යම් පොලිස් නිලධරයෙකුට එවැනි නියෝගයකට එරෙහිව ලිඛිත අභියාචනයක් පොලිස් කොමිෂන් සභාවට ඉදිරිපත්කල හැකිවන පරිදි අංක 2436/11 සහ 2025 මැයි 16 දිනැති **"අභියාචනා කාර්ය පටිපාටික රීති"** අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීම ප්‍රකාශයට පත්කරනු ලැබීය. මෙමගින් ස්ථාන මාරු, උසස්කිරීම්, විනය නියෝග සහ සේවය අතහැර යාම ආදීය සම්බන්ධයෙන් පොලිස්පති ඇතුළු ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගේ නියෝග වලට එරෙහිව කොමිෂන් සභාවට අභියාචනා කිරීමට හැකියාව ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 උ (3) (අ) වන ව්‍යවස්ථාව යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව පොලිස් නිලධාරීන්ගේ ආයතනික කටයුතු එනම්, පොලිස් නිලධරයන් පත්කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම වැනි කටයුතුවලදී මෙතෙක් උපයෝගී කරගත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වෙනුවට පොලිස් නිලධාරීන්ගේ රාජකාරි ස්වභාවයන්ට සහ සේවා තත්ත්වයට ගැලපෙන පරිදි නව කාර්ය පටිපාටික රීති පොලිස් කොමිෂන් සභාව විසින් පොලිස්පතිවරයා විමසා සකස් කර ඇති අතර

එලෙස කෙටුම්පත් කරන ලද පොලිස් කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහය නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කර ඇත.

හත්වන පොලිස් කොමිෂන් සභා වාරය තුළ 2025 වර්ෂය අවසන් වනවිට ජාතික පොලිස් කොමිෂන් සභා ඉතිහාසයේ පළමුවරට කොමිෂන් සභා පත්‍රිකා 10,000ට වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කිරීම පොලිස් කොමිෂන් සභාව ලැබූ විශාල ජයග්‍රහණයකි.

2024 වර්ෂය තුල දී මහජන පැමිණිලි විමර්ශන අවසන් කිරීමේ සමස්ථ ප්‍රතිශතය 17.41% ක අගයක් ගත් නමුත් 2025 වර්ෂයේ දී විමර්ශන අවසන් කිරීමේ සමස්ථ ප්‍රතිශතය 50.45% දක්වා වර්ධනය කර ගැනීමට සමත් වී ඇත. ආයතන හා විනය අංශය වෙත 2023 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා ලැබී ඇති විනය ගොනු ප්‍රමාණයෙන් විනය කෘත්‍යයන් අවසන් කිරීමේ 51% ක ප්‍රගතියක් වාර්තා කර ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා පොලිසියේ ස්ථාන මාරු පටිපාටිය සංශෝධනය කොට නව ස්ථාන මාරු පටිපාටියක් සකස්කර අනුමත කිරිමට කටයුතු කරන ලද අතර මෙම ස්ථාන මාරු පටිපාටිය 2026.02.01 දින සිට බලාත්මක වේ.

අනුමතව පැවති ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් හා නියාමන සේවා ගනය සඳහා වන (පොලිස් කොස්තාපල්) බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය හා අනුමතව පැවති ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් හා නියාමන සේවා ගණය සඳහා වන (උප පොලිස් පරීක්ෂක) බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය සංශෝධනය කොට නව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය සකස් කර අනුමත කරන ලදී.

2025 වර්ෂය තුළදී ශ්‍රී ලංකා පොලිසියේ සහකාර පොලිස් අධිකාරී (සීමිත) 51 දෙනෙකු , නියෝජ්‍ය පොලිස්පති 41 දෙනෙකු සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා උසස්වීම් ලබා දීමට කටයුතු කර ඇත. එසේම 2026 වර්ෂය තුළදී ද ශ්‍රී ලංකා පොලිසියේ සහකාර පොලිස් අධිකාරී විවෘත පදනමින්, සීමිත පදනමින් හා කුසලතා පදනමින් බඳවා ගැනීම් කටයුතු සිදු කිරීමට සහ නියෝජ්‍ය පොලිස්පති තනතුරට උසස් කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කරමින් පවතී.

**අභියෝග**

හත්වන කොමිෂන් සභාව 2023 වර්ෂයේ කටයුතු ආරම්භ කරනවිට නව බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තරම් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් ජාතික පොලිස් කොමිෂන් සභා කාර්යාලය සතුව නොමැතිවීම එම බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පැවති විශාල අභියෝගයක් මෙන්ම බාධාවක් විය. ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත අත්‍යවශ්‍ය කාර්ය මණ්ඩලය අනුමත කරගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

වෙත ඉල්ලීම් ගණනාවක් ඉදිරිපත් කරමින් විවිධ උත්සාහයන් දැරුවද මෙතෙක් අපේක්ෂිත කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට නොහැකි වී ඇති අතර තවදුරටත් ඒ පිළිබඳව උත්සාහයන් දරමින් සිටී. එසේම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්ය මණ්ඩලය අතරින් ද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/III ශ්‍රේණිවල අනුමත තනතුරු 08 ක් ඇතුළුව මුළු පුරප්පාඩු සංඛ්‍යාව 26 ක කාර්යමණ්ඩල හිඟයක් ද සහිතව කොමිෂන් සභාවට කටයුතු කිරීමට සිදුවී ඇති බව සඳහන් කළ යුතුය.

විනය ගොනු ආශ්‍රිතව කටයුතු කිරීමේදී විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීමට කාලයක් ගතවීම, පරීක්ෂණ නිලධාරීන් ලෙස සිවිල් සංවිතයේ නිලධාරීන් පත් කරනු ලැබූවද ඔවුන් විසින් පොලිස් නිලධාරීන්ගේ විනය ගොනුවලට අදාළ විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීමට අකමැතිවීම හා ප්‍රතික්ෂේප කිරීම යන ජාතික පොලිස් කොමිෂන් සභාවේ පාලනයෙන් බැහැර කරුණු හේතුවෙන් විනය ගොනු සම්බන්ධ කටයුතු අවසන් කිරීමට කාලයක් ගතවීම.

තනූජා එන්. ප්‍රනාන්දු

ලේකම්

ජාතික පොලිස් කොමිෂන් සභාව

# 03 පරිච්ඡේදය
# 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

## 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු. | | සටහන | තතය 2025 රු. | 2024 රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 232,264,000 | 197,465,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 248,269 | 856,471 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 6,993,724 | 5,664,541 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **239,505,993** | 203,986,012 | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **239,505,993** | 203,986,012 | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | - | 94,768 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | 239,505,993 | 203,891,244 | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | ඒසීඒ-2(ii) |
| 118,850,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 116,733,256 | 96,700,675 | ඒසීඒ-2(ii) |
| 113,150,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 107,564,219 | 94,938,545 | ඒසීඒ-2(ii) |
| 500,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 423,235 | 419,331 | ඒසීඒ-2(ii) |
| - | පොලී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | ඒසීඒ-2(ii) |
| 232,500,000 | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **224,720,710** | 192,058,551 | |
| | **මූලධන වියදම්** | | | | |
| 2,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 1,528,332 | 1,214,317 | ඒසීඒ-2(ii) |
| 10,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 9,589,353 | 9,507,770 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 500,000 | හැකියා වර්ධනය | 14 | 489,867 | 500,000 | ඒසීඒ-2(ii) |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | - | ඒසීඒ-2(ii) |
| 12,500,000 | **මුළු මූලධන වියදම් (උ)** | | **11,607,552** | 11,222,087 | |
| | තැන්පතු ගෙවීම් | | 230,194 | 864,421 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 7,865,957 | 5,203,719 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | 8,096,151 | 6,068,140 | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 244,424,413 | 209,348,778 | |
| 245,000,000 | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **(4,918,420)** | (5,457,534) | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | (4,918,420) | (5,457,534) | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | | | ඒසීඒ-3 |
| | | | - | - | |

1

**මූලාශ්‍රය: ගිණුම් අංශයේ දත්ත ඇසුරෙනි.**

## 3.2 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

**2025 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | තත්‍ය 2025 රු. | 2024 රු. |
|---|---|---|---|
| **<u>මූල්‍ය නොවන වත්කම්</u>** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 95,031,667 | 85,777,542 |
| **<u>මූල්‍ය වත්කම්</u>** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 11,630,093 | 10,757,860 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **106,661,760** | **96,535,402** |
| **<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම | | 11,612,018 | 10,757,860 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 95,031,667 | 85,777,542 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | - | - |
| **<u>ජංගම වගකීම්</u>** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 18,075 | - |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **106,661,760** | **96,535,402** |

පිටු අංක 07 සිට 30 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 31 සිට 55 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය **ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| ........................ | ................. | ........................................ |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2026/02/24 | දිනය : 2026/02/24 | දිනය : 2026/02/24 |

තනුජා එම් පුනාන්දු
ලේකම්
ජාතික පොලිස් කොමිෂන් සභාව
ගොඩනැගිලි අංක. 09, BMICH පරිශ්‍රය
කොළඹ 07.

**මූලාශ්‍රය: ගිණුම් අංශයේ දත්ත ඇසුරෙනි.**

## 3.3 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

**2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | සටහන | 2025<br>රු. | සංශෝධිත<br>2024<br>රු. |
|---|---|---|---|
| <u>**මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | | |
| මුළු බදු ලැබීම් | | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | - | - |
| ලාභ | | - | - |
| ආදායම් නොවන ලැබීම් | | 5,010,968 | 4,383,227 |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | - | - |
| අග්‍රිම ලැබීම් | | 232,264,000 | 197,465,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | | 7,275,733 | 6,525,124 |
| තැන්පතු ලැබීම් | | 248,269 | 856,471 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | | **244,798,970** | **209,229,822** |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 224,489,312 | 191,425,496 |
| සහනාධාර සහ මාරුකිරීම් | | 423,235 | 419,331 |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම් | | 1,528,332 | - |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 672,587 | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | - | 94,768 |
| අත්තිකාරම් ගෙවීම් | | 7,865,957 | 5,203,719 |
| තැන්පතු ගෙවීම් | | 230,194 | 864,421 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | | **235,209,617** | **198,007,735** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | | **9,589,353** | **11,222,087** |
| <u>**ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | | |
| පොළී | | - | - |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - | - |
| උපණය අයකර ගැනීම් | | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | | - | - |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | | |
| මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් | | 9,589,353 | 11,222,087 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | | **9,589,353** | **11,222,087** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | | **(9,589,353)** | **(11,222,087)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | | **0** | **-** |
| <u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | | |
| දේශීය ණය ගැනීම් | | - | - |
| විදේශීය ණය ගැනීම් | | - | - |
| ප්‍රදානයන් ලැබීම් | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | | - | - |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)** | | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | | - | - |

3

**මූලාශ්‍රය: ගිණුම් අංශයේ දත්ත ඇසුරෙනි.**

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

මූල්‍ය ප්‍රකාශන වල ඇති ඉහත සියලු අගයන් භාණ්ඩාගාර ප්‍රකාශන සමඟ සැසඳේ.

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු. ,000

| ආදයම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම් | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසන් ආදායම් ඇස්තමේන්තුවේ % ක් ලෙස |
| 20.02.02.99 (12202099) | පොලිය-වෙනත් | | | 489 | අදාල නොවේ. |
| 20.03.99.00 (12399000) | අනෙකුත් ලැබීම් | | | 638 | |
| 20.04.01.00 (12401000) | වැ.අ.වි.වැටුප් දායක මුදල් | | | 2,912 | |
| 2002.01.01 (12201001) | රජයේ වත්කම් වලින් ලැබෙන ආදායම් -රජයේ ගොඩනැගිලි | | | 8 | |
| 2006.02.01 (12602001) | ප්‍රාග්ධන ආදායම් - වාහන | | | 288 | |
| 2006.02.02 (12602002) | ප්‍රාග්ධන ආදායම් -වෙනත් | | | 48 | |

මූලාශ්‍රය: ගිණුම් අංශයේ දත්ත ඇසුරෙනි.

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ක් ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 183,000 | 195,791 | 192,059 | 98.09% |
| ප්‍රාග්ධන | 8,000 | 11,624 | 11,222 | 96.54% |

මූලාශ්‍රය: ගිණුම් අංශයේ දත්ත ඇසුරෙනි.

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදනවල % ක් ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 1 | අදාල නැත | අදාල නැත | අදාල නැත | අදාල නැත | අදාල නැත | අදාල නැත |

මූලාශ්‍රය: ගිණුම් අංශයේ දත්ත ඇසුරෙනි.

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2025 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2025 මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ක් ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | නැත. | නැත. | නැත. | |
| 9152 | යන්ත්‍රෝපකරණ | 85,778 | 85,778 | නැත. | 100 |
| 9153 | ඉඩම් | නැත. | නැත. | නැත. | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | නැත. | නැත. | නැත. | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | නැත. | නැත. | නැත. | |
| 9160 | ක්‍රියාත්මක වන වැඩ | නැත. | නැත. | නැත. | |
| 9180 | බදු දෙන ලද වත්කම් | නැත. | නැත. | නැත. | |

මූලාශ්‍රය: ගිණුම් අංශයේ දත්ත ඇසුරෙනි

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. ජේඑල්ඔ/ඩී/එන්පීසී/එෆ්ආර්/2025 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2026 මැයි 30දින

**ලේකම්**
**ජාතික පොලිස් කොමිෂන් සභාව**

**ශීර්ෂය 008 - ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය 008 - ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත්කළ යුතු විගණකාධිපති වාර්තාව යථාකාලයේ දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමුකරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ජාතික පොලිස් කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ජාතික පොලිස් කොමිෂන් සභාව,

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

2

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 වියදම් කළමනාකරණය**

සමාලෝචිත වර්ෂයේ වැය විෂයන් 08 අදාළව මුදල් රෙගුලාසි 66 මඟින් රු.12,500,000ක ප්‍රතිපාදන මාරුකර තිබුණු අතර, එය එක් එක් වැය විෂයන්වල මූලික ඇස්තමේන්තු හා සැසඳීමේ දී සියයට 09 සිට සියයට 40 දක්වා පරාසයක ප්‍රතිශතයක් විය.

**3.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| **නීතිරීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | (i) චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව රාජ්‍ය ආයතන සතු සියලුම වාහනවල ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකළ යුතු වුවත්, කොමිෂම සතු වාහන 07හි ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස කොමිෂන් සභාවට අයත් මෝටර් රථයක දෛනික ධාවන සටහන් අනුව 2026 මාර්තු 09 වන විගණිත දිනය වන විට ඉන්ධන ටැංකිය තුළ ඉතිරිව පවතින ඉන්ධන ප්‍රමාණය ලීටර් 156.62ක් දක්වා ඉහළ ගොස් තිබුණි. මෙය අසාමාන්‍ය තත්ත්වයක් බව නිරීක්ෂණය විය. |
| | (ii) රාජ්‍ය ආයතනවල පවතින වාහන අළුත්වැඩියා කිරීමේ දී අළුත්වැඩියාවට පෙර අදාළ අළුත්වැඩියාව සිදුකළ යුතු බවටත් අළුත්වැඩියා කිරීමෙන් පසු නියමිත පරිදි අළුත්වැඩියා කටයුතු සිදුවී ඇති බවටත් යාන්ත්‍රික ඉංජිනේරුවෙකුගෙන් අනුමතකර ගත යුතු වුවත්, කොමිෂන් සභාවේ වාහන සඳහා සිදුකරන ලද අළුත්වැඩියාවන් සඳහා පෙර සහ පසු අනුමැතීන් ලබාගෙන නොතිබුණි. |

3

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

#### 4.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම

**(අ) මහජන පැමිණිලි විමර්ශනය**

විගණනයට ලබා දී තිබුණු තොරතුරු අනුව පොලිස් නිලධාරියෙකුට හෝ පොලිස් සේවයට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන මහජන පැමිණිලි විමර්ශන අංශයේ ප්‍රගතිය පහත පරිදි විය.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට විමර්ශන කටයුතු අවසන්කළ යුතුව තිබූ මහජන පැමිණිලි සංඛ්‍යාව 3,905ක් වන අතර, ඉන් පැමිණිලි 2,145ක් 2024ට පෙර කාලපරිච්ඡේදයේ ලැබී තිබුණු මහජන පැමිණිලි විය. එය සියයට 55ක්ද ඉක්මවා තිබුණි.

(ii) ජාතික පොලිස් කොමිෂන් සභාවට 2021 වර්ෂයේ සිට 2025 දක්වා පිළිවෙලින් 1,893, 1,676, 2,448, 2,863ක් හා 2,979ක් ලෙස පොලිසියේ ක්‍රියාකාරීත්වයට එරෙහි මහජන පැමිණිලි සංඛ්‍යාව ක්‍රමිකව වැඩිවෙමින් ලැබී තිබුණු අතර, ඉකුත් වර්ෂ හා සැසඳීමේ දී පොලිස් අත්අඩංගුවේ සිටිය දී මරණයට පත්වීමට එරෙහිව අභියාචනා 05ක් ද ලැබී තිබුණු බැවින් මහජනතාව වෙත ශ්‍රී ලංකා පොලිසියේ කාර්යභාරය ඉටුකිරීමේ ප්‍රගතිය මතභේදයට තුඩු දෙන කරුණක් විය.

**(ආ) නීති ඒකකය**

සමාලෝචිත වර්ෂය අවසානයට ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ නඩු 123ක් ක්‍රියාත්මක වෙමින් පැවති අතර, අභියාචනාධිකරණය තුළ 2010 වර්ෂයේ සිට පැවත එන එක් නඩුවකුත්, ශ්‍රේෂ්ඨාධිකරණයේ 2016, 2018, 2019 සහ 2020 වර්ෂවලට අදාළව පිළිවෙලින් නඩු 4, 1, 5 සහ 28ක් ලෙස නොවිසඳුනු නඩු 38ක් පැවතුණි. ඒ අනුව 2020 වර්ෂයට පෙර ගොනු කරන ලද නමුත් මේ වන විටත් නොවිසඳී ඇති නඩු ප්‍රමාණය සමාලෝචිත වර්ෂය අවසානයට නොවිසඳා ඇති මුළු නඩු සංඛ්‍යාව සමඟ සැසඳීමේ දී සියයට 32ක් පමණ විය.

**(ඇ) ආයතන හා විනය අංශය**

සමාලෝචිත වර්ෂය තුළ විනය නියෝග ලබාදිය යුතු මුළු විනය ලිපිගොනු 240කින් ලිපිගොනු 123කට පමණක් තීරණ ලබා දී තිබූ අතර, තවදුරටත් විනය නියෝග ලබාදිය යුතු ලිපිගොනු සංඛ්‍යාව 117ක් විය. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරු 05ක් සඳහා විනය චෝදනා එල්ල වී තිබුණු අතර, ඉන් එක් පුද්ගලයෙකුට පමණක් සමාලෝචිත වර්ෂය තුළ දී විනය නියෝග ලබා දී තිබුණි.

**(ඈ) අභියාචනා අංශය**

(i) 2024 වර්ෂය සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාවට අනුව අභියාචනා අංශය තුළ ක්‍රියාත්මක මට්ටමේ පවතින ලිපිගොනු සංඛ්‍යාව 4,507ක් ලෙස දක්වා ඇති අතර, සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද කෙටුම්පත් කාර්ය සාධන වාර්තාවේ 2025 ජනවාරි 01 දිනට එම ගොනු සංඛ්‍යාව 4,368ක් ලෙස දක්වා ඇත. ඒ අනුව ඉකුත් වර්ෂය අවසාන දිනට පැවති ලිපිගොනු හා ප්‍රවර්ථන වර්ෂයේ ආරම්භක දිනට වන ලිපිගොනු සංඛ්‍යාව අතර ලිපිගොනු 139ක වෙනසක් විය.

(ii) සමාලෝචිත වර්ෂයේ අවසානයට දිනට ලැබී ඇති අභියාචනා 7,651න් සියයට 47ක් හෙවත් අභියාචනා 3,587ක් සඳහා කොමිෂන් සභා තීරණ ලබා දී නොතිබුණි.

### 4.2 අනාර්ථික ගනුදෙනු

ජාතික පොලිස් කොමිෂන් සභාව ආරම්භයේ සිටම කුලී පදනම මත BMICH පරිශ්‍රයේ පිහිටි බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමට අයත් ගොඩනැගිල්ලක වාර්ෂිකව ගිවිසුම්වලට එළැඹෙමින් පවත්වාගෙන යනු ලබයි. සමාලෝචිත වර්ෂය සඳහා වන ගිවිසුම අනුව දැනට කොමිෂන් සභා කාර්යාලය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල සහ අනෙකුත් ගොඩනැගිල්ල සඳහා මාසයකට රු.5,700,162 බැගින් සමාලෝචිත වර්ෂය සඳහා රු.67,098,969ක් හෙවත් වර්ෂයේ මුළු අයහාර වියදමෙන් සියයට 30ක පමණ කුලී මුදලක් ගෙවා තිබුණි.

### 4.3 කළමනාකරණ දුර්වලතා

(අ) කොමිෂන් සභාවේ අරමුණු ඉටුකර ගැනීමට ප්‍රමාණවත් මානව සම්පතක් නොමැතිවීම හේතුවෙන් ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් නිලධාරීන් 32ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් ලෙස සේවයේ යොදවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ දී ශ්‍රී ලංකා පොලිසියට එරෙහි මහජන පැමිණිලි ඇතුළු ජාතික පොලිස් කොමිෂන් සභාවට මහජන පැමිණිලි, අභියාචනා සහ ආයතන හා විනය අංශයන් වෙත ලද පොලිසිය සම්බන්ධ පැමිණිලි 10,737ක් වූ අතර, පොලිස් නිලධාරීන්ට එරෙහිව ලැබෙන මහජන පැමිණිලි සහ අභියාචනා විමර්ශන කිරීම සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් ලෙස ශ්‍රී ලංකා පොලිසියේ, පොලිස් නිලධාරීන් යොදවා තිබීම හේතුවෙන් අදාළ විමර්ශන ස්වාධීනව හා අපක්ෂපාතිව ඉටුකිරීමට නොහැකිවීමේ අවදානමක් නිරීක්ෂණය විය.

### 5. යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කොමිෂම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිතකර නොතිබුණු අතර, මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳව අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට නොහැකි වී තිබුණි.

### 6. මානව සම්පත් කළමනාකරණය

ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම් තනතුර 2023 ජනවාරි 31 දින සිට පුරප්පාඩුව තිබුණු අතර, එදින සිට 2026 මාර්තු 11 වන විගණිත දිනය දක්වා අවස්ථා දෙකක දී අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශ විසින් අදාළ තනතුරට ගැළපෙන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් 07දෙනෙකුගේ නම් යෝජනාකර අදාළ නිලධාරීන් ද මනාපය පළකර තිබිය දී, ඒ සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාවේ නිර්දේශය නොලැබීම මත 2023 ජනවාරි 31 දින සිට 2025 මාර්තු 31 දින දක්වා කොන්ත්‍රාත් පදනම මත වසර 02ක් ද, 2025 අප්‍රේල් 01 සිට 2025 ජූලි 31 දක්වා රාජකාරී ඉටුකිරීමේ පදනම මත ද, 2025 අගෝස්තු 01 දින සිට මේ දක්වා වසරක කාලසීමාවක් සඳහා පූර්ණකාලීන වැඩ බැලීමේ පදනම මත ද ලේකම් තනතුර සඳහා නිලධාරීන් යොදවා තිබුණි.

කේ. කේ. එස්. ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

5

# 04 පරිච්ඡේදය
# කාර්ය සාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරකම් සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100%- 90% | 75%-89% | 50%- 74% |
| රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු වීම් සහ විනය කටයුතු සම්බන්ධයෙන් ලැබෙන අභියාචනා/ඉල්ලීම් සඳහා සාධාරණ කාලයක් ඇතුළත සහන සැලසීම. | ✓ | | |
| රාජ්‍ය නිවේදිත නොවන නිලධාරීන්ගේ සහ පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු වීම් සහ විනය කටයුතු සම්බන්ධයෙන් ලැබෙන අභියාචනා/ඉල්ලීම් සඳහා සහන සැලසීමේ ප්‍රගතිය | | ✓ | |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරයේ සහ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ පවතින නඩු සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු ඉටු කිරීම සම්බන්ධයෙන් වන ප්‍රගතිය | | ✓ | |
| ජාතික පොලිස් කොමිෂන් සභාවට ලැබෙන සියලු මහජන පැමිණිලි විමර්ශනය කිරීම සහ සහන සැලසීම. | | ✓ | |
| 1960 දුරකථන අංකයට ලැබෙන ඇමතුම්/ඉල්ලීම් සඳහා සහන සැලසීමේ ප්‍රගතිය | ✓ | | |
| කාර්ය මණ්ඩලය දැනුමින්, කුසලතාවලින් සහ ආකල්ප වලින් සන්නද්ධ කිරීමේ අරමුණෙන් වාර්ෂික මානව සම්පත් පුහුණු සැලැස්ම අනුව පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම. | ✓ | | |
| මහජනයාට හා පොලිස් නිලධාරින්ට පහසුවෙන් ප්‍රවේශ වීමට හැකිවන පරිදි ජාතික පොලිස් කොමිෂන් සභාවේ වෙබ් අඩවිය වැඩිදියුණු කිරීම සහ යාවත්කාලීන කිරීම. | | ✓ | |
| තොරතුරු දැන ගැනීමේ පනත යටතේ මහජනයා හා පොලිස් නිලධාරින් විසින් කර ඇති සියලු තොරතුරු ඉල්ලීම සඳහා අවසන් ප්‍රතිචාර දැක්වීම. | ✓ | | |
| පාර්ලිමේන්තුවට සහ ජනාධිපති කාර්යාලය වෙත යොමුකළ යුතු පරිපාලන වාර්තා කලට වේලාවට යැවීම. | ✓ | | |
| ජාතික පුවත්පත් වෙත ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරීම, සහ සාවද්‍ය ප්‍රවෘත්ති නිවැරදි කිරීම් කටයුතු කිරීම. | ✓ | | |
| කාර්යය මණ්ඩලයේ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව, වාර්ෂික කාර්ය සාධන ඇගයීම, ශ්‍රේණිගත උසස් කිරීම්, වැටුප් පරිවර්තන සකස් කිරීම | ✓ | | |

# 05 පරිච්ඡේදය

# තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

## 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු.

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| SDG ඉලක්ක 16<br>සාමය,යුක්තිය සහ ශක්තිමත් ආයතන | මහජනයා හා පොලිස් නිලධාරින් විසින් ඉල්ලා සිටින තොරතුරු ඉල්ලීම් සියල්ලටම ප්‍රතිචාර දැක්වීම. | 2025 වර්ෂය තුළ ඉදිරිපත් වූ තොරතුරු ඉල්ලීම් 281 කින් ඉල්ලීම් 250 කට අදාලව තොරතුරු ලබා දී ඇති අතර ඉල්ලීම් 18 ක් ප්‍රතික්ෂේප කර ඇත. | | | ✓ |
| සෑම මට්ටමකදීම වගකීමට බැඳී සිටින සහ විනිවිදභාවයකින් යුත් ඵලදායී ආයතන සංවර්ධනය කිරීම. | ජාතික පොලිස් කොමිෂන් සභාව සඳහා මහජන උපායමාර්ග සංවර්ධනය කිරීම. | | | ✓ | |
| සියලු මට්ටමකට ධාරිතා සංවර්ධනය සඳහා අන්තර්ජාතික සහයෝගීතාවය තුළින් ජාතික පොලිස් කොමිෂන් සභාවේ සමස්ත ධාරිතාව සංවර්ධනය කිරීම. | දේශීය හා විදේශීය කාර්යාල පුහුණුව හරහා ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ දැනුම කුසලතා හා ආකල්ප ඉහළ නැංවීම. | වේගවත් සේවා සම්පාදනයට මහජන අභියාචනාවන්ට ක්ෂණික ප්‍රතිචාරය වේගවත් සහනය ලබාදීම. | | ✓ | |

මූලාශ්‍රය: පාලන අංශයේ දත්ත ඇසුරෙනි.

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

ජාතික පොලිස් කොමිෂන් සභාවට අදාල තිරසර සංවර්ධන ඉලක්ක වන්නේ SDG ඉලක්ක 5,16,17 වේ. එනම් 5 - ස්ත්‍රීපුරුෂ සමාජභාවී සමානාත්මතාවය, 16 - සාමය යුක්තිය සහ ශක්තිමත් ආයතන, සහ 17 - ඉලක්ක සපුරාගැනීම සඳහා හවුල්කාරීත්වය වේ.  මෙම ඉලක්ක සපුරා ගැනීමේදී ජාතික පොලිස් කොමිෂන් සභාවට අභියෝග ගණනාවකට මුහුණපෑමට සිදුවිය. ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල හා කාර්යභාරය නිරන්තරයෙන් වෙනස්වීම හේතුකොට ගෙන මෙම ඉලක්ක සපුරාගැනීමේ උපායමාර්ග සැලසුම්වලට බාධා ඇතිවිය. විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ තාක්ෂණික සහ මූල්‍ය අනුග්‍රහය යටතේ 2016 සිට ක්‍රියාත්මක කළ වැඩසටහන් 20 වන සංශෝධනයත් සමඟ අඩාල වූ අතර නැවත 21 වන සංශෝධනයෙන් බලතල ලැබීමත් සමග ඉහත වැඩසටහන් තුළින් තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා මේ වනවිට කටයුතු සැලසුම් කර ඇත.

ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් 2024 වර්ෂයේ ආරම්භ කර 2025 වර්ෂය පුරාම ක්‍රියාත්මක කල පොලිස් කොට්ඨාස මට්ටමින් පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන මගින් ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල, කාර්යභාරය සහ කොමිෂන් සභාවෙන් මහජනතාවට මෙන්ම පොලිස් නිලධාරීන් හට ලබාදෙන සේවාවන් පිළිබඳව පුළුල් දැනුවත් කිරීමක් සිදුකර ඇත. මෙහි ප්‍රධාන අරමුණක් වූයේ කොමිෂන් සභාවේ වැදගත් පාර්ශව කරුවන් හට ස්වාධීන කොමිෂන් සභාවක් ලෙස පොලිස් කොමිෂන් සභාවෙන් ලැබෙන ප්‍රතිලාභ ඵලදායී ලෙස ලබා ගැනීම සඳහා ප්‍රවේශය පහසු කරලීම සහ එමගින් ආයතන ශක්තිමත් කිරීම යි.

# 06 පරිච්ඡේදය
# මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය (2025.12.31 දිනට)

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/ (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 31 | 21 | 10 |
| තෘතීයික | 04 | 03 | 01 |
| ද්විතීයික | 79 | 65 | 14 |
| ප්‍රාථමික | 19 | 15 | 04 |

මූලාශ්‍රය: පාලන අංශයේ දත්ත ඇසුරෙනි.

## 6.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

අනුමත කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු සඳහා නිලධාරින් අනුයුක්ත නොකිරීම හේතුවෙන් දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවී ඇති අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන්ගේ පුරප්පාඩු පැවතීම ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්ය සාධනයට ඍජුව බලපෑම් කර ඇත. තවද රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ලද ලිපි ගොනු සහ දෛනික අභියාචනා කඩිනමින් අවසන් කිරීමට මානව සම්පත් හිඟය බලපෑම් කර ඇති නමුත් පවතින මානව සම්පත කළමනාකරණය කර ගනිමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පවරන ලද බලතලවලට අදාළ කාර්යයන් ඉටු කිරීමට කටයුතු කර ඇත.

## 6.3 කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය

| පුහුණු වැඩසටහනේ නම | පුහුණුකල නිලධාරින් සංඛ්‍යාව | පුහුණු වැඩ සටහනේ කාලසීමාව | සමස්ත ආයෝජනය (රු.මි) (දේශීය/විදේශීය) | වැඩ සටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ල බාගත් දැනුම |
|---|---|---|---|---|---|
| භාණ්ඩ වැඩ හා උපදේශණ නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශණය | 35 | පැය 03 | 0.041 | දේශීය අරමුදල් මඟින් | නිලධාරින්ගේ විෂය දැනුම, ආකල්ප හා අවබෝධය වර්ධනය වීම |
| English Diploma – Remaining Amount | 01 | වසරක | 0.0085 | | |
| රාජ්‍ය වැටුප් සැකසීම පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | දින 01 | 0.036 | | |
| 2016 අංක 12 දරණ තොරතුරු පනත පිළිබඳව දැනුවත් කිරිමේ වැඩසටහන | 25 | දින 01 | - | | |
| විනය කටයුතු පිළිබඳ පුහුණු වැඩමුළුව | 25 | පැය 02 | - | | |
| 2016 අංක 12 දරණ තොරතුරු පනත පිළිබඳව දැනුවත් කිරිමේ වැඩ සටහන | 30 | පැය 3½ | 0.0079 | | |
| රියදුරු පුහුණු වැඩ සටහන | 02 | දින 01 | 0.018 | | |
| භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ නව වෙනස්කම් | 02 | දින 01 | 0.026 | | |
| කාර්යාල ක්‍රම හා ලිපිගොනුකරණය | 35 | පැය 03 | 0.013 | | |
| පරිපාලන නීතිය හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව | 01 | වසර 01 | 0.053 | | |
| විනය කාර්ය පටිපාටි - චෝදනා පත්‍ර සකස් කිරිම හා නිදහස් කිරිම | 35 | දින 01 | 0.042 | | |
| Workshop on Mastering the Government Payroll System | 01 | දින 02 | 0.015 | | |
| Office system with digital file Management | 01 | දින 02 | 0.015 | | |
| The 16th National Cyber Security Conference | 02 | දින 01 | 0.02 | | |
| Advanced AI Tools for Productivity | 02 | දින 01 | 0.015 | | |
| Workshop on Service Disciplinary procedures | 04 | දින 02 | 0.06 | | |
| Workshop on MS Office Essentials | | දින 02 | 0.015 | | |
| අල්ලස් හා දූෂණ විරෝධි පනත පිළිබද දැනුවත් කිරීම | 140 | පැය 03 | 0.057 | | |
| විධිමත් ලෙස කාර්යාල කටයුතු පවත්වාගෙන යාම | 30 | පැය 03 | - | | |
| ආතති කළමනාකරණය සම්බන්ධ පුහුණු වැඩසටහන | 100 | පැය 3½ | 0.033 | | |

මූලාශ්‍රය: පාලන අංශයේ දත්ත ඇසුරෙනි.

# 07 පරිච්ඡේදය
# අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මුල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දින ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මුල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අනුකූල නොවේ | අදාල නැත. | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | අනුකූල නොවේ | අදාල නැත. | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | අදාල නැත. | |
| 1.6 | වෙනත් | අනුකූල නොවේ | අදාල නැත. | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල නොවේ | අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නැත. | මෙම තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී ඇති අතර රා.ප.අමා. වෙත දැනුම් දී ඇත. රා.පරි. අමාත්‍යාංශය විසින් මෙතෙක් අභ්‍යන්තර විගණන නිලධරයෙකු පත්කිරීම සිදුකර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යා වක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල නොවේ | අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කර නැත. | මෙම තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී ඇති අතර රා.ප.අමා. වෙත දැනුම් දී ඇත. රා.පරි. අමාත්‍යාංශය විසින් මෙතෙක් අභ්‍යන්තර විගණන නිලධරයෙකු පත්කිරීම සිදුකර නැත. |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තු සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කිරීම | අනුකූල නොවේ | අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කර නැත. | මෙම තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී ඇති අතර රා.ප.අමා. වෙත දැනුම් දී ඇත. රා.පරි. අමාත්‍යාංශය විසින් මෙතෙක් අභ්‍යන්තර විගණන නිලධරයෙකු පත්කිරීම සිදුකර නැත. |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කර නැත. | මෙම තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී ඇති අතර රා.ප.අමා. වෙත දැනුම් දී ඇත. රා.පරි. අමාත්‍යාංශය විසින් මෙතෙක් අභ්‍යන්තර විගණන නිලධරයෙකු පත්කිරීම සිදුකර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කර නැත. | මෙම තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී ඇති අතර රා.ප.අමා. වෙත දැනුම් දී ඇත. රා.පරි. අමාත්‍යාංශය විසින් මෙතෙක් අභ්‍යන්තර විගණන නිලධරයෙකු පත්කිරීම සිදුකර නැත. |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණනකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කර නැත. | මෙම තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී ඇති අතර රා.ප.අමා. වෙත දැනුම් දී ඇත. රා.පරි. අමාත්‍යාංශය විසින් මෙතෙක් අභ්‍යන්තර විගණන නිලධරයෙකු පත්කිරීම සිදුකර නැත. |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන කළමනාකරණ කමිටු 04ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| **8** | **වත්කම් කළමනාකරණ** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණ කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ. | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්න්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලැඹීම. | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 37 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | ආදායම් මුදල් රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම.** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල නොවේ. | | ආයතනයේ ඇතැම් අංශ විසින් සිය පුරවැසි/ සේවාලාභී ප්‍රඥාප්තිය සම්පාදනය කර අවසන් කිරීමෙන් පසුව ආයතනයේ සමස්ත පුරවැසි සේවාලාභී ප්‍රඥාප්තිය ප්‍රකාශයට පත්කර ක්‍රියාත්මක කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | | ආයතනයේ සමස්ත පුරවැසි සේවාලාභී ප්‍රඥාප්තිය ප්‍රකාශයට පත්කර ක්‍රියාත්මක කරනවිට ඇගයීම් ක්‍රමවේදය සකස් කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

අවසානය

ඇමුණුම 01

# ජාතික පොලිස් කොමිෂන් සභාවේ
# පළාත් කාර්යාල

| | |
|---|---|
| **බස්නාහිර පළාත**<br><br>පළාත් අධ්‍යක්ෂ (බස්නාහිර පළාත)<br>ගොඩනැගිලි අංක 09, **BMICH**,<br>කොළඹ 07.<br><br>☎ : 0112166521, 0112166522,<br>0112166540, 0112166530, 0112683879<br>ෆැක්ස් : 0112166555 | **උතුරු පළාත**<br><br>පළාත් අධ්‍යක්ෂ (උතුරු පළාත)<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,<br>යාපනය.<br><br>☎ 0112166535 |
| **සබරගමුව පළාත**<br><br>පළාත් අධ්‍යක්ෂ (සබරගමුව පළාත)<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,<br>නව නගරය, රත්නපුර.<br><br>☎ : 0112166538 | **උතුරු මැද පළාත**<br><br>පළාත් අධ්‍යක්ෂ (උතුරු මැද පළාත)<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,<br>අනුරාධපුරය.<br><br>☎ : 0112166531 |
| **ඌව පළාත**<br><br>පළාත් අධ්‍යක්ෂ (ඌව පළාත)<br>අංක 05, පීලිපොතගම පාර,<br>බදුල්ල.<br><br>☎ : 0112166532 | **දකුණු පළාත**<br><br>පළාත් අධ්‍යක්ෂ (දකුණු පළාත)<br>පළමු මහල,<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල.<br><br>☎ : 0112166534 |
| **වයඹ පළාත**<br><br>පළාත් අධ්‍යක්ෂ (වයඹ පළාත)<br>3 වන මහල, අංක. 08 කාමරය,<br>පේෂකර්ම වෙළඳ සංකීර්ණය,<br>අංක 04, මිහිදු මාවත,<br>කුරුණෑගල.<br><br>☎ : 0112166536 | **මධ්‍යම පළාත**<br><br>පළාත් අධ්‍යක්ෂ (මධ්‍යම පළාත)<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,<br>මහනුවර.<br><br>☎ : 0112166537 |
| **නැගෙනහිර පළාත**<br><br>පළාත් අධ්‍යක්ෂ (නැගෙනහිර පළාත)<br>ග්‍රීන් වීදිය,<br>මඩකලපුව.<br><br>☎ : 0112166533 | |